# 4 මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව

## 4.1 සමස්ත නිරීක්ෂණ

**පිරිවැය පීඩනයන් සහ සැපයුම් අංශයෙහි සිදු වූ බාධාවන් ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන 2012 වසරේ දී උද්ධමනය ඉහළ නැගුණ ද එය අඛණ්ඩව සිව්වන වසරටත් තනි අංකයක මට්ටමෙහි පැවතිණි.** උද්ධමනය ලක්ෂ්‍යමය සහ වාර්ෂික සාමාන්‍යය යන දෙයාකාරයටම පිළිවෙළින්, 2009 වසරේ පෙබරවාරි මස සහ 2009 වසරේ අගෝස්තු මස සිට තනි ඉලක්කමක මට්ටමෙහි පැවතිණි. 1973 වසර මැද සිට කාලය සැලකූ විට, උද්ධමනය තනි ඉලක්කමක මට්ටමෙහි පැවති දීර්ඝතම කාලපරිච්ඡේදය මෙය වේ. 2012 පෙබරවාරි මාසයේ දී සියයට 2.7 ක් දක්වා පහළ වැටුණු ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමන අනුපාතිකය එතැන් සිට ඉහළට යමින් 2012 ජූලි මාසයේ දී සියයට 9.8 ක උපරිම මට්ටමට ළඟා විය. එය වසරේ ඉතිරි කාලය තුළ ඉහළ තනි ඉලක්කමක මට්ටමෙහි පැවතුණ ද 2012 දෙසැම්බර් මාසයේ දී සියයට 9.2 ක් දක්වා මද වශයෙන් පහළ වැටිණි. වසරේ මුල් මාස කිහිපය තුළ දක්නට ලැබුණු සාපේක්ෂව පහළ උද්ධමනය කෙරෙහි ආහාර අයිතමයන්ගේ දේශීය සැපයුමෙහි සිදු වූ වර්ධනයන් සහ ආනයනික භාණ්ඩවල ජාත්‍යන්තර වෙළෙඳපොළ මිල ගණන් පහළ යාම හේතු විය. 2012 වසරේ දෙවන කාර්තුවේ සිට දක්නට ලැබුණු උද්ධමනය ඉහළ යාමේ නැඹුරුව කෙරෙහි ඛනිජ තෙල් නිෂ්පාදන, එල්.පී. ගෑස්, විදුලිය හා බස් ගාස්තුවල පරිපාලිත මිල ගණන් ඉහළ නංවමින් කළ සංශෝධන, රුපියල අවප්‍රමාණ වීම, සමහර ආනයනික භාණ්ඩ මත වූ බදු ඉහළ නැංවීම සහ නියඟය හා ගංවතුර යන දෙයාකාරයේම අයහපත් කාලගුණික තත්ත්වයන් මගින් වගා හානි වීම නිසා ආහාර මිල ගණන් ඉහළ යාම ආදී කරුණු රැසක් හේතු විය. සැපයුම් අවහිරතාවයන් හේතුවෙන් ආහාර මිල ගණන් ඉහළ යාම තාවකාලික වුව ද, 2011 වසරේ පැවති පහළ පදනම ද උද්ධමනය ඉහළ මට්ටමක පැවතීමට දායක විය. මූර්ත වැටුප් ඉහළ යාම ද උද්ධමනය මත යම් තරමක පිරිවැය සහ ඉල්ලුම් පීඩනයන් ඇති කරන්නට ඇත. කෙසේ වුවද, කෘෂි නිෂ්පාදනයන්හි සැපයුම් තත්ත්වයන් වර්ධනය වීමත්, සමහර පරිපාලිත මිල ගණන් හා ආනයනික භාණ්ඩ මත වන බදු පහළ දැමීමත්, ඉල්ලුම් කළමනාකරණ උපායමාර්ග සමගින් උද්ධමන අපේක්ෂාවන් කළමනාකරණය කිරීමත් වසර පුරා උද්ධමනය තනි ඉලක්කමක මට්ටමෙහි පවත්වා ගැනීමට උපකාරී විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමන අනුපාතිකය 2012 ජනවාරි මස පැවති සියයට 6.5 හි සිට 2012 මැයි මාසයේ දී සියයට 5.6 දක්වා ඒකාකර ලෙස පහළ වැටුණු නමුත් එතැන් සිට එම නැඹුරුව ප්‍රතිවර්තනය කරමින් වසර අවසානයේ දී සියයට 7.6 දක්වා ඉහළ නැගිණි. මේ අතර, වාර්ෂික සාමාන්‍ය පදනම මත මූලික උද්ධමනය 2012 සැප්තැම්බර් මාසය දක්වා අඛණ්ඩව පහළ වැටුණු නමුත් එතැන් සිට වසර අවසානයේ දී සියයට 5.8 දක්වා ක්‍රමිකව ඉහළ නැගිණි. ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය වසර පුරා ඉහළ නැගීමේ නැඹුරුවක් පෙන්වමින් 2012 දෙසැම්බර් මාසයේ දී සියයට 7.6 ක් ලෙස වාර්තා කළේය.

**රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙහිම සේවකයන්ගේ නාමික වැටුප් 2012 වසරේ දී ඉහළ ගිය අතර, විධිමත් පෞද්ගලික අංශය ඉහළම වැටුප් වැඩිවීම වාර්තා කළේය.** සමස්තයක් ලෙස, විධිමත් සහ අවිධිමත් පෞද්ගලික අංශවල සේවකයන් මූර්ත වැටුප් ඉහළ යාම් අත්විඳි අතර, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් මද වශයෙන් පහළ වැටිණි. රාජ්‍ය අංශයේ සේවකයන්ගේ (මධ්‍යම රජයේ විධායක නොවන නිලධාරීන්, සුළු සේවකයන් සහ රජයේ

පාසල් ගුරුවරුන්) නාමික වැටුප් ඉහළ යාම කෙරෙහි අයවැය යෝජනාවකට අනුව 2012 ජනවාරි මාසයේ සිට ගෙවන ලද විශ්‍රාම වැටුපට හිමිකම් නොලබන දීමනාවක් හේතු විය. පඩි පාලක සභා රෙගුලාසි මගින් වැටුප් පරිපාලනය කෙරෙන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය මගින් මැන දැක්වෙන සමස්ත නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය 2012 වසර තුළ දී සියයට 22.2 කින් ඉහළ ගියේය. මෙම වැඩිවීමට මුළුමනින්ම හේතු වූයේ කෘෂිකර්මාන්ත අංශයේ සේවකයන්ගේ අවම වැටුප් 2012 වසර තුළ දී සියයට 29.3 කින් ඉහළ නැංවීමයි. කෘෂිකර්මාන්ත අංශයේ මූර්ත වැටුප්වල සිදු වූ සියයට 20.4 ක සැලකිය යුතු වැඩිවීම කර්මාන්ත හා වාණිජ සහ සේවා යන අංශයන්හි සිදු වූ මූර්ත වැටුප් පහළ යාම මගින් යම් දුරකට පියවෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, විධිමත් පෞද්ගලික අංශයෙහි මූර්ත වැටුප්වල සමස්ත ඉහළ යාම සියයට 13.8 ක් විය. පසුගිය වසර කිහිපයෙහි දක්නට ලැබුණු නැඹුරුව අනුව යමින් අවිධිමත් පෞද්ගලික අංශයෙහි සේවකයන්ගේ නාමික සහ මූර්ත වැටුප් 2012 වසරේ දී ද ඉහළ ගියේය.

**සේවා වියුක්ති අනුපාතය 2011 වසරේ දී වූ සියයට 4.2 හි සිට 2012 වසරේ දී මෙතෙක් වාර්තා වූ අඩුම අගය වන සියයට 4 ක් දක්වා අඩු විය.** යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ඇතුළුව පුළුල් පදනමකින් හා තිරසාර ලෙස සිදු වූ ආර්ථික වර්ධනය සේවා වියුක්තිය අඩු වීම කෙරෙහි දායක විය. සමස්ත සේවා නියුක්තිය තුළ කර්මාන්ත හා සේවා අංශයන්හි ඉහළ යමින් පවතින දායකත්වය සහ කෘෂිකර්මාන්ත අංශයෙහි පහළ යමින් පවතින දායකත්වය සහිතව සේවා නියුක්ති සංයුතියෙහි ප්‍රධාන කර්මාන්ත කාණ්ඩ අතර වෙනසක් වාර්තා විය. 2012 වසරේ දී රැකියා සැපයීමෙහිලා සේවා අංශය ප්‍රධාන ලෙස දායක විය. රාජ්‍ය, පෞද්ගලික සහ ස්වයං රැකියා අංශවල රැකියා අවස්ථා වසර තුළ දී ඉහළ ගියේය. අ.පො.ස. (උසස් පෙළ) හා ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් ඇති තරුණ කොටස් අතර සේවා වියුක්ති අනුපාතය පහළ යාම සාධනීය වර්ධනයකි. කෙසේ වුවද, තරුණ කොටස් අතර සේවා වියුක්ති අනුපාතය තවමත් රටෙහි සමස්ත සේවා වියුක්ති අනුපාතයට වඩා බෙහෙවින් ඉහළ අගයක් ගන්නා බැවින් කාර්මික, වෘත්තීය සහ තොරතුරු තාක්ෂණය මත පදනම් වූ පුහුණුවක් ඇතුළත් විශේෂිත අධ්‍යාපන හා කුසලතා වර්ධන වැඩපිළිවෙළක් මගින් තරුණයන් රැකියා වලට වඩාත් සුදුසු වන පරිදි ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. පසුගිය වසර කිහිපය පුරා දක්නට ලැබුණු ශ්‍රම ඵලදායිතාවෙහි වැඩි වීම 2012 වසරේ දී ද දැකිය හැකි විය. තවද, රටෙහි විදේශ විනිමය ඉපැයුම්වල ප්‍රධාන මූලාශ්‍රයක් වන විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්ව යාම් සංඛ්‍යාව ද 2012 වසරේ දී සැලකිය යුතු ලෙස වැඩි විය.


## 4.2 මිල

### මිල විචලනයන් සහ දායක වූ සාධක

#### කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.)

**නිල පාරිභෝගික මිල දර්ශකය වන කො.පා.මි. දර්ශකය (2006/07=100), 2011 දෙසැම්බර් මස පැවති 154.4 හි සිට 2012 දෙසැම්බර් මාසයේ දී 168.6 දක්වා දර්ශකාංක 14.2 කින් නිරපේක්ෂ වශයෙන් ඉහළ නැගිණි.** ලක්ෂ්‍යමය උද්ධමන අනුපාතිකය 2012 දෙසැම්බර් මාසයේ දී සියයට 9.2 ක් දක්වා ඉහළ නැගීම මෙමගින් පිළිබිඹු වේ. 2011 දෙසැම්බර් මාසයේ දී ලක්ෂ්‍යමය උද්ධමන අනුපාතිකය සියයට 4.9 ක් විය. ආහාර වර්ගවල මිල ගණන් අඩුවීම හේතුවෙන් 2012 පෙබරවාරි මාසයේ දී ලක්ෂ්‍යමය උද්ධමන අනුපාතිකය එහි අඩුම අගය වූ සියයට 2.7 දක්වා පහළ වැටුණු නමුත් ඉන්පසු ඛනිජ තෙල් මිල ගණන්, විදුලිය ගාස්තු සහ බස් ගාස්තු 2012 පෙබරවාරි මස සිට ඉහළ දැමීමත්, දෙවැනි කාර්තුවේ සිට නියගය හේතුවෙන් ආහාර මිල ගණන් නැවත වැඩිවීමත් සමග උද්ධමන අනුපාතිකය ඉහළ යාමේ නැඹුරුවක් ඇරඹීය. එහි ප්‍රතිඵලයක් ලෙස, ලක්ෂ්‍යමය උද්ධමනය 2012 ජූලි මාසයේ දී උච්චතම අගයක් වන සියයට 9.8 දක්වා ඉහළ නැගිණි. ඉන්පසු තරමක් දුරට අඩු වූ උද්ධමන අනුපාතය දෙසැම්බර් මාසයේ දී සියයට 9.2 ක් ලෙස වාර්තා කෙරිණි. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2012 වසරේ මුල් මාස පහ තුළ පහළ යාමක් දක්වමින් මැයි මාසයේ දී සියයට 5.6 දක්වා ළඟා වුව ද ඉන්පසු ක්‍රමයෙන් ඉහළ නගිමින් 2012 දෙසැම්බර් මාසයේ දී සියයට 7.6 ක් දක්වා වැඩි විය.

**4.1 රූප සටහන** **කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (2006/07 = 100)**



**4.1 සංඛ්‍යා සටහන**

**මිල දර්ශකවල වෙනස්වීම්**

| දර්ශකය | දර්ශකය (වසර අග) | | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 (අ) | 2011 දෙසැ./ 2010 දෙසැ. | 2012 දෙසැ./ 2011 දෙසැ. (අ) | 2011/2012 | 2012/2011 (අ) |
| කො.පා.මි.ද. (2006/07=100) | 147.2 | 154.4 | 168.6 | 4.9 | 9.2 | 6.7 | 7.6 |
| තොග මිල දර්ශකය (1974=100) | 4,416.1 | 4,148.5 | 4,719.0 | -6.1 | 13.8 | 10.6 | 3.5 |
| ද.දේ.නි. අවධමනකය | 338.9 | 365.5(ආ) | 398.0 | - | - | 7.9 | 8.9 |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2012 වසරේ දී උද්ධමනය කෙරෙහි ආහාර නොවන කාණ්ඩය ප්‍රධාන දායකත්වය සැපයූ අතර, පරිපාලිතව තීරණය කෙරෙන මිල ගණන් ඉහළ නැංවීම මේ සඳහා මූලික වශයෙන් හේතු විය.** ඒ අනුව, වසර තුළ සමස්ත කො.පා.මි. දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වෙනස සඳහා ආහාර නොවන කාණ්ඩය සියයට 70.7 කින් දායක විය. ආහාර නොවන කාණ්ඩය තුළ, කො.පා.මි. දර්ශකයේ භාණ්ඩ පැසෙහි පිළිවෙළින් සියයට 12.3 ක් හා සියයට 23.7 ක් වූ සාපේක්ෂව වඩා ඉහළ බරතැබීම් දරන ප්‍රවාහන සහ නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන උප කාණ්ඩයන් 2012 වාර්ෂික සාමාන්‍ය උද්ධමනය කෙරෙහි පිළිවෙළින් සියයට 34.7 කින් සහ සියයට 24.9 බැගින් දායක විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත ප්‍රවාහන උප දර්ශකය සියයට 21.6 කින් ඉහළ යාම සඳහා ඉන්ධන මිල ගණන් හා බස් ගාස්තු ඉහළ නැංවීම දායක වූ අතර, නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන උප දර්ශකයෙහි සියයට 9.6 ක වැඩිවීම සඳහා ජල ගාස්තු, විදුලිය ගාස්තු, එල්.පී. ගෑස් සහ භූමිතෙල් මිල ගණන් ඉහළ නැංවීම හේතු විය. ආහාර නොවන කාණ්ඩයේ අනෙකුත් උප දර්ශකයන් වන රෙදිපිළි හා පාවහන්; සෞඛ්‍යය; අධ්‍යාපන; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු; සංස්කෘතික හා විනෝදාත්මක; සහ විවිධ භාණ්ඩ හා සේවා ආදිය වාර්ෂික සාමාන්‍ය උද්ධමනය කෙරෙහි සුළු වශයෙන් දායක විය. සන්නිවේදන උප දර්ශකය වසර තුළ නොවෙනස්ව පැවතිණි.

**කො.පා.මි. දර්ශකයේ සියයට 41 ක් වැනි ඉහළම බරතැබුමක් සහිත ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප දර්ශකය, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය කෙරෙහි සියයට 29.3 ක දායකත්වයක් සැපයීය.** කො.පා.මි. දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය පදනම සහ ලක්ෂ්‍යමය පදනම යන දෙයාකාරයෙහිම උපනතිය විශාල වශයෙන් ආහාර උප දර්ශකයට සමගාමීව විචලනය විය. ආහාර උප දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වෙනස 2012 ජනවාරි මස පැවති සියයට 7.8 හි සිට ජූනි මාසයේ දී සියයට 2.8 දක්වා සැලකිය යුතු ලෙස පහළ වැටුණු අතර, එතැන් සිට ක්‍රමිකව ඉහළ නගිමින් 2012 දෙසැම්බර් මස දී සියයට 4.7 ක් දක්වා ළඟා විය. එළවළු, පොල්, සීනි සහ බිත්තර ආදියේ මිල සැලකිය යුතු ලෙස පහළ යාම හේතුවෙන් ලක්ෂ්‍යමය පදනම මත ආහාර උප දර්ශකයේ වෙනස් වීම වසරේ පළමු තෙමස තුළ සෘණ අගයන් ගත් නමුත් එතැන් පටන් එය තියුණු ලෙස ඉහළ යමින් නොවැම්බර් මාසයේ දී සියයට 9.9 ක උච්චතම අගයට ළඟා වූ අතර, එය දෙසැම්බර් මාසයේ දී සියයට 9 ක් දක්වා අඩු විය. දැඩි වර්ෂාපතනය සහ ගංවතුර තත්ත්වය හේතුවෙන් එළවළු මිල ගණන් ඉහළ යාම වසර අවසාන කාලයේ දී වඩා වැඩි ශීඝ්‍රතාවකින් ආහාර උප දර්ශකය ඉහළ නැංවීමට හේතු විය. තවද, පරිප්පු, බිත්තර, රතු ළූණු, පොල් සහ පොල් තෙල් වැනි ප්‍රධාන ආහාර අයිතමයන්ගේ සාමාන්‍ය මිල ගණන් පහළ යාම, 2012 වසරේ දී මෙම උප දර්ශකය මත මිල පීඩනයක් ඇතිවීම පාලනය කිරීමට විශාල වශයෙන් ඉවහල් විය. කෙසේ වුවද, 2012 වසරේ දී තිරිඟු පිටි, පාන්, කිරි පිටි, සීනි, ලොකු ළූණු, මත්ස්‍ය හා මුහුදු ආහාර, කරවල, මස් සහ පිටතින් ලබා ගන්නා ආහාර ආදියේ මිල ගණන් ඉහළ ගියේය.

**2012 යල කන්නයේ වී අස්වැන්නෙහි අඩු වීම පිළිබිඹු කරමින් වසරේ දෙවන භාගයේ දී සහල් මිල ගණන් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන සහල්වල බර තැබූ සාමාන්‍ය මිල සුළු වශයෙන් ඉහළ ගියේය.** මහ කන්නයේ ඉතා විශාල වී අස්වනු ලැබීමත් සමග වෙළෙඳපොළෙහි ප්‍රමාණවත් තොග පැවතීම වසරේ මුල් මාස පහ තුළ සහල් මිල ගණන් පහළ මට්ටමක පවත්වා ගැනීමට උපකාරී විය. කෙසේ වුවද, ප්‍රධාන වගා බිම් ආශ්‍රිතව පැවති අයහපත් කාලගුණික තත්ත්වයන්ගේ බලපෑමෙන් යල කන්නයේ වී අස්වැන්න අඩු වීම, වසරේ දෙවන අර්ධය තුළ සහල් මිල ගණන් ක්‍රමිකව ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, වී සඳහා වූ සහතික මිල ද සියයට 10 කින් ඉහළ නැංවිණි. මේ සියලු කරුණු හේතුවෙන් 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සියලුම සහල්

**4.2 සංඛ්‍යා සටහන** **ආනයනික සහ දේශීයව නිෂ්පාදිත ප්‍රධාන අයිතමයන්ගේ සිල්ලර මිල ගණන්**

| අයිතමය | ඒකකය | කො.පා.මි.ද. (2006/07=100) භරිත % | මිල රු. | | | | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වාර්ෂික සාමාන්‍යය | | | 2010 දෙසැ. | 2011 දෙසැ. | 2012 දෙසැ. | වාර්ෂික සාමාන්‍යය | | ලක්ෂ්‍යමය | |
| | | | 2010 | 2011 | 2012 | | | | 2011/ 2010 | 2012/ 2011 | 2011 දෙසැ./ 2010 දෙසැ. | 2012 දෙසැ./ 2011 දෙසැ. |
| **දේශීය** | | | | | | | | | | | | |
| සම්බා සහල් | කි.ග්‍රෑ.1ක් | 1.96 | 72.05 | 68.38 | 70.15 | 72.30 | 68.19 | 74.06 | -5.1 | 2.6 | -5.7 | 8.6 |
| රතු කැකුළු සහල් | ,, | 0.85 | 60.14 | 57.27 | 57.08 | 59.19 | 56.80 | 60.58 | -4.8 | -0.3 | -4.0 | 6.7 |
| සුදු කැකුළු සහල් | ,, | 0.60 | 54.26 | 56.58 | 56.26 | 57.89 | 56.33 | 60.46 | 4.3 | -0.6 | -2.7 | 7.3 |
| නාඩු සහල් | ,, | 0.35 | 60.79 | 59.25 | 59.67 | 60.95 | 58.95 | 62.73 | -2.5 | 0.7 | -3.3 | 6.4 |
| පොල් (මධ්‍යම ප්‍රමාණය) | ගෙඩියක් | 1.84 | 33.59 | 41.01 | 34.76 | 47.18 | 33.78 | 38.22 | 22.1 | -15.2 | -28.4 | 13.1 |
| මාළු (කෙළවල්ලා) | කි.ග්‍රෑ.1ක් | 1.11 | 598.15 | 632.32 | 694.14 | 639.43 | 652.30 | 718.18 | 5.7 | 9.8 | 2.0 | 10.1 |
| බෝංචි | ,, | 0.43 | 135.26 | 167.34 | 157.60 | 157.17 | 175.07 | 160.65 | 23.7 | -5.8 | 11.4 | -8.2 |
| වම්බටු | ,, | 0.19 | 87.04 | 90.84 | 99.25 | 105.75 | 87.31 | 113.28 | 4.4 | 9.3 | -17.4 | 29.7 |
| බිත්තර | එකක් | 0.37 | 13.60 | 11.64 | 11.29 | 16.53 | 9.67 | 14.49 | -14.4 | -3.0 | -41.5 | 49.8 |
| **ආනයනික** | | | | | | | | | | | | |
| සීනි | කි.ග්‍රෑ.1ක් | 1.12 | 93.78 | 96.11 | 101.04 | 99.61 | 92.91 | 105.50 | 2.5 | 5.1 | -6.7 | 13.6 |
| කිරිපිටි - ඇන්කර් | ග්‍රෑ.400ක් | 3.21 | 234.35 | 255.92 | 302.35 | 244.00 | 264.00 | 325.00 | 9.2 | 18.1 | 8.2 | 23.1 |
| රතු පරිප්පු | කි.ග්‍රෑ.1ක් | 0.73 | 165.40 | 149.20 | 145.07 | 168.32 | 131.95 | 146.18 | -9.8 | -2.8 | -21.6 | 10.8 |
| තිරිඟු පිටි | ,, | 0.20 | 69.61 | 83.92 | 90.92 | 82.43 | 84.07 | 98.46 | 20.6 | 8.3 | 2.0 | 17.1 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වර්ගවල සාමාන්‍ය මිල සියයට 3.1 කින් ඉහළ ගියේය. 2010 වසර අග සිට රජය මගින් සහල් මත පැනවූ මිල සීමාව, සහල් මිල ගණන් ඉහළ යාම පාලනය කිරීම සඳහා යම්තාක් දුරකට ආයක විය.

**කාලගුණික දුෂ්කරතා හේතුවෙන් වගා හානි සිදු වුවද පෙර වසරට සාපේක්ෂව 2012 වසරේ දී එළවළුවල බරතැබූ සාමාන්‍ය මිල පහළ ගියේය.** 2011 වසර සමග සැසඳීමේ දී 2012 වසරේ දී උඩරට එළවළු සහ පලා වර්ග යන උප කාණ්ඩ දෙකෙහි ම බරතැබූ සාමාන්‍ය මිල ගණන් පහළ වැටුණු අතර, පහත රට එළවළු උප කාණ්ඩයේ මිල ගණන් ඉහළ ගියේය. සැපයුම් තත්ත්වයන්හි සිදු වූ වර්ධනයන් හේතුවෙන් බොහෝ එළවළු වර්ගවල මිල ගණන් 2012 පෙබරවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ සැලකිය යුතු ලෙස අඩු විය. කෙසේ වුවද, ප්‍රධාන වගා බිම් ආශ්‍රිතව පැවති නියං තත්ත්වය හේතුවෙන් මැයි සහ ජූනි මාසවල දී මිල ගණන් ඉහළ ගියේය. එතැන් පටන් එළවළු මිල ගණන් අඩු වූ නමුත්, දිවයිනට බලපෑ දැඩි වර්ෂාව සහ ගංවතුර තත්ත්වයන් හේතු කොටගෙන සිදු වූ අස්වනු හානිය සහ ප්‍රවාහන බාධා නිසා නොවැම්බර් මාසයේ පටන් නැවත මෙම මිල ගණන් ඉහළ නැගිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, එළවළුවල බරතැබූ වාර්ෂික සාමාන්‍ය මිල 2011 වසරට වඩා 2012 වසරේ දී අඩු මට්ටමක පැවතිය ද, 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා එළවළු උප කාණ්ඩයේ බරතැබූ සාමාන්‍ය මිල සියයට 12.7 ක ඉහළ යාමක් වාර්තා කළේය. මේ අතර, 2012 වසරේ දී පොල් නිෂ්පාදනය ඉහළ යාම සහ එහි ජාත්‍යන්තර වෙළෙඳපොළ මිල ප්‍රවණතාවන් හේතු කොට ගෙන පොල් සහ පොල් තෙල්වල සාමාන්‍ය මිල ගණන් පිළිවෙළින් සියයට 19.2 කින් සහ සියයට 21.9 කින් පහත වැටිණි. කෙසේ වුවද, පොල් මිල ගණන් වසරේ පළමු මාස පහ තුළ දී ඉහළ මට්ටමක පැවතිණි. 2011 වසර හා සැසඳීමේ දී, 2012 වසරේ දී, රතු ළූණු හා අර්තාපල්වල සාමාන්‍ය මිල ගණන් පිළිවෙළින් සියයට 37.4 කින් හා සියයට 1.3 කින් පහත වැටුණු අතර, ලොකු ළූණු මිල ගණන් සියයට 2.3 කින් ඉහළ ගියේය. 2012 වසරේ දී රතු ළූණු මිල ගණන් හි සිදු වූ ශීඝ්‍ර පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ උතුරු පළාතෙන් ලද සැපයුම ඉහළ යාමයි.

**නැවුම් මත්ස්‍ය, මුහුදු ආහාර සහ කරවල මිල ගණන් ඉහළ ගියේය.** 2012 වසරේ දී මත්ස්‍ය නිෂ්පාදනය සියයට 9.3 කින් වර්ධනය වුවද, නිෂ්පාදන පිරිවැය ඉහළ යාම සහ ඉල්ලුම ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන, නැවුම් මත්ස්‍ය හා මුහුදු ආහාරවල බරතැබූ සාමාන්‍ය මිල සියයට 11.7 කින් ඉහළ ගියේය. 2012 වසරේ දී බොහෝ මත්ස්‍ය වර්ගවල මිල ගණන් ඉහළ යාම සියයට 6.4 ක්-සියයට 17.9 ක් දක්වා පරාසයක ඉහළ යාම් වාර්තා කළේය. කෙසේ වුවද, සෘතුමය සාධක හේතුවෙන්, ලොකු සහ කුඩා මාළු දෙවර්ගයේම බරතැබූ සාමාන්‍ය මිල පෙබරවාරි සිට අප්‍රේල් දක්වා සහ ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා කාලවල දී අඩු මට්ටමක පැවතිණි. සියලුම කරවල වර්ගවල මිල ගණන් ද සියයට 7.5 ත් සියයට 24 ත් දක්වා පරාසයක සැලකිය යුතු ඉහළ යාමක් වාර්තා කළේය. මේ අතර, 2012 වසරේ දී දේශීය සැපයුම් වර්ධනය හේතුවෙන් බිත්තර මිල

**4.3 සංඛ්‍යා සටහන** **පරිපාලිත මිල සංශෝධන 2010 - 2012**

| අයිතමය | ඒකකය | මිල (වසර අවසානයේ දී) රුපියල් | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | | 2010 | 2011 | 2012 | 2011/2010 | 2012/2011 |
| ඩීසල් - ලං. ඛ. නි. සං. | ලී. 1ක් | 73.00 | 84.00 | 115.00 | 15.1 | 36.9 |
| ඩීසල් - ලං. ඉ. තෙ. සං. | „ | 73.00 | 84.00 | 121.00 | 15.1 | 44.0 |
| භූමිතෙල් | „ | 51.00 | 71.00 | 106.00 | 39.2 | 49.3 |
| පෙට්‍රල් | „ | 115.00 | 137.00 | 159.00 | 19.1 | 16.1 |
| ගෑස් - ලිට්‍රො | කි.ග්‍රෑ. 12.5 | 1,652.00 | 2,046.00 | 2,246.00 | 23.8 | 9.8 |
| ගෑස් - ලාෆ් | කි.ග්‍රෑ. 12.5 | 1,520.00 | 2,046.00 | 2,246.00 | 34.6 | 9.8 |
| දැව්තෙල් (1000) | ලී. 1ක් | 48.70 | 48.70 | ලැ.නො. | 0.0 | ලැ.නො. |
| දැව්තෙල් (1500) | „ | 40.00 | 50.00 | 90.00 | 25.0 | 80.0 |
| දැව්තෙල් (3500) | „ | 40.00 | 50.00 | 90.00 | 25.0 | 80.0 |
| විදුලිය ගාස්තු - ස්ථාවර ගාස්තු | ඒකක පරාසය | | | | | |
| | 0-30 | 60.00 | 30.00 | 30.00 | -50.0 | 0.0 |
| | 31-60 | 90.00 | 60.00 | 60.00 | -33.3 | 0.0 |
| | 61-90 | 120.00 | 90.00 | 90.00 | -25.0 | 0.0 |
| | 91-180 | 180.00 | 315.00 | 315.00 | 75.0 | 0.0 |
| | 180ට වැඩි | 240.00 | 315.00 | 315.00 | 31.3 | 0.0 |
| විදුලිය ගාස්තු - ඒකක ගාස්තු | ඒකක පරාසය | | | | | |
| | 0-30 | 3.00 | 3.00 | 3.00 | 0.0 | 0.0 |
| | 31-60 | 4.70 | 4.70 | 4.70 | 0.0 | 0.0 |
| | 61-90 | 7.50 | 7.50 | 7.50 | 0.0 | 0.0 |
| | 91-1 | 16.00 | 21.00 | 21.00 | 31.3 | 0.0 |
| | 121-180 | 16.00 | 24.00 | 24.00 | 50.0 | 0.0 |
| | 181-600 | 25.00 | 36.00 | 36.00 | 44.0 | 0.0 |
| | 600ට වැඩි | 25.00 | 36.00 | 36.00 | 44.0 | 0.0 |
| විදුලිය ගාස්තු - ඉන්ධන ගැලපුම් (අ) | ඒකක පරාසය | | | | | |
| | 0-30 | - | - | - | - | 25.0 |
| | 31-60 | - | - | - | - | 35.0 |
| | 61ට වැඩි | - | - | - | - | 40.0 |
| ජල ගාස්තු - ඒකක ගාස්තු | ඒකක පරාසය | | | | | |
| | 0-5 | 3.00 | 3.00 | 8.00 | 0.0 | 166.7 |
| | 6-10 | 7.00 | 7.00 | 11.00 | 0.0 | 57.1 |
| | 11-15 | 15.00 | 15.00 | 20.00 | 0.0 | 33.3 |
| | 16-20 | 30.00 | 30.00 | 40.00 | 0.0 | 33.3 |
| | 21-25 | 50.00 | 50.00 | 58.00 | 0.0 | 16.0 |
| | 26-30 | 75.00 | 75.00 | 88.00 | 0.0 | 17.3 |
| බස් ගාස්තු | | | | | 7.6 | 20.0 |

(අ) 2012.02.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමස්ත මාසික විදුලි ගාස්තුව මත පමණක් ඉන්ධන ගැලපුම් ගාස්තුව නැවත පනවන ලදී.

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

ගණන් සාමාන්‍ය වශයෙන් සියයට 6.7 කින් පහත වැටුණු අතර, කුකුළු මස් මිල ගණන් සියයට 1.4 කින් සුළු වශයෙන් ඉහළ ගියේය.

**වසර තුළ දී, ඉන්ධන හා එල්.පී. ගෑස් මිල ගණන් සහ විදුලිය ගාස්තු ඉහළ නංවමින් කළ සංශෝධන උද්ධමනය මත සෘජු සහ වක්‍ර යන දෙයාකාරයෙන්ම පීඩනයක් ඇති කළේය.** ඇඩි ලෙස උච්චාවචනය වූ බොර තෙල් බැරලයක ආනයන මිල ගණන් එ.ජ.ඩොලර් 96.60 සහ එ.ජ.ඩොලර් 121.21 අතර විචලනය විය. රුපියල අවප්‍රමාණය වීම ද, තෙල් ආනයනය සඳහා දැරීමට සිදු වූ රුපියල් පිරිවැය ඉහළ නැංවීය. 2012 වසර තුළ දී සිදු කළ මිල සංශෝධනයන් හේතුවෙන් ඩීසල්, පෙට්‍රල් සහ භූමිතෙල් මිල ගණන් පිළිවෙළින් සියයට 36.9 කින්, සියයට 16.1 කින් සහ සියයට 49.3 කින් ඉහළ ගියේය. විශේෂයෙන්, ඩීසල් ඇතුළු ඉන්ධන මිල ගණන් ඉහළ යාම, නිෂ්පාදන පිරිවැය සහ ප්‍රවාහන වියදම් ඉහළ නැංවීම හරහා පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල ගණන් මත අහිතකර බලපෑමක් ඇති කළේය. බස් ගාස්තු ද 2012 වසරේ පෙබරවාරි 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 20 කින් ඉහළ නංවන ලදී. මෙම මිල

සංශෝධන අනුව යමින්, 2012 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලයේ දී එල්.පී. ගෑස්වල සාමාන්‍ය මිල සියයට 9.8 කින් ඉහළ නැගිණි. 2012 වසරේ පෙබරවාරි මස සිට බලපැවැත්වෙන පරිදි විදුලිය බිල් මත සියයට 25-40 දක්වා පරාසයක ඉන්ධන ගැලපුම් ගාස්තුවක් පනවන ලදී. මෙම මිල සංශෝධනවල වක්‍ර බලපෑම පිළිබිඹු කරමින්, සකසන ලද ආහාරවල මිල ද ඉහළ නැගිණි. පරිභෝජනය කරනු ලබන ඒකක ගණන මත පදනම්ව, ජලය සඳහා වන ඒකක හා සේවා යන ගාස්තු දෙවර්ගයම 2012 වසරේ ඔක්තෝබර් මස සිට ඉහළ නංවන ලදී.

**ජාත්‍යන්තර වෙළෙඳපොළේ මිල වර්ධනයන්ට සමගාමීව, තෝරාගත් ආනයනික ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ගණන් ද ඉහළ නැංවිණි.** 2012 වසරේ දී, තිරිඟු පිටි හා පාන්වල සාමාන්‍ය මිල ගණන් පිළිවෙළින් සියයට 7.9 කින් හා සියයට 16.9 කින් ඉහළ ගියේය. 2012 වසරේ මැයි මස 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ග්‍රෑම් 400 ක් බරති කිරිපිටි පැකට්ටුවක උපරිම විකුණුම් මිල රුපියල් 61 කින් ඉහළ නැංවීම හේතුවෙන් 2012 වසරේ දී කිරිපිටිවල බරතැබූ සාමාන්‍ය මිල සියයට 19.9 කින් ඉහළ නැගිණි.

**සමහර ආනයනික ආහාර අයිතමයන්ට අදාළ වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද වසර තුළ කිහිප වාරයක් සංශෝධනය කිරීම ද, කො.පා.මි. දර්ශකය මත බලපෑමක් ඇති කළේය.** දේශීය නිෂ්පාදකයන් ආරක්ෂා කිරීම සහ දේශීය වෙළෙඳපොළේ මිල ගණන් ස්ථාවරව පවත්වා ගැනීම මෙම සංශෝධනයන්හි අරමුණ විය. ඒ අනුව, 2012 වසරේ ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි සීනි, පරිප්පු සහ සුදු ළූණු මත වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද වැඩිවන ලෙස ගැලපුම් කරන ලදී. එලෙසම, 2012 වසරේ මැයි මස සිට ලොකු ළූණු සහ සීනි මත වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉහළ නංවන ලදී. දේශීය වෙළෙඳපොළේ ශීඝ්‍ර මිල ඉහළ යාම පාලනය කිරීම සඳහා 2012 වසරේ ජූලි මස සිට ලොකු ළූණු, අර්තාපල්, ටින් මාළු, කරවල සහ හාල්මැස්සන් මත වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද අඩුවන පරිදි සංශෝධනය කරන ලදී. අස්වනු නෙළීම ඇරඹීමත් සමග, දේශීය ගොවීන් ආරක්ෂා කිරීම සඳහා අර්තාපල් සහ ලොකු ළූණු මත වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද අගෝස්තු මාසයේ සිට ඉහළ නංවන ලදී. 2012 වසරේ සැප්තැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි, අර්තාපල් සහ ටින් මාළු මත වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද තවදුරටත් ඉහළ නංවන ලදී. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් අයහපත් කාලගුණික තත්ත්වයන් හේතු කොටගෙන දේශීය වෙළෙඳපොළේ පැවති ඉහළ මිල ගණන් සැලකිල්ලට ගනිමින් 2012 වසරේ දෙසැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි අර්තාපල්, ලොකු ළූණු සහ රතු ළූණුවල දේශීය මිල ගණන් ස්ථායී කිරීම සඳහා එම භාණ්ඩ මත වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පහත හෙළන ලදී.

**කො.පා.මි. දර්ශකයේ භාණ්ඩ පැසෙන් නැවුම් ආහාර, සහල්, පොල්, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කොට ගණනය කරනු ලබන මූලික උද්ධමනය ද, වාර්ෂික සාමාන්‍ය සහ ලක්ෂ්‍යමය යන දෙයාකාරයෙන්ම ඉහළ නැගිණි.** වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය, අඛණ්ඩව අඩු වෙමින් 2012 වසරේ සැප්තැම්බර් මස වනවිට සියයට 5.3 ක් වූ අතර, ඉන්පසු ක්‍රමයෙන් ඉහළ යමින් වසර අවසානයේ දී සියයට 5.8 ක් කරා ළඟා විය. මේ අතර, වසරේ මුල් භාගය තුළ දී මැද තනි ඉලක්කමක මට්ටමෙහි පැවති ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2012 දෙසැම්බර් වනවිට සියයට 7.6 ක් දක්වා ක්‍රමයෙන් ඉහළ නැගිණි. 2012 වසරේ දී මූලික උද්ධමන දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය වෙනස කෙරෙහි ආහාර හා මධ්‍යසාර නොවන පාන (සියයට 60.8 කින්) නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 8.8 කින්) ප්‍රවාහන (සියයට 8.4 කින්) සහ රෙදිපිළි හා පාවහන් (සියයට 7.9 කින්) යන උප දර්ශක ප්‍රධාන දායකත්වය සැපයීය.

### තොග මිල දර්ශකය

**ප්‍රාථමික වෙළෙඳපොළ මට්ටමෙහි මිල විචලනය වූ ආකාරය පෙන්නුම් කරනු ලබන තොග මිල දර්ශකය (1974=100), 2012 වසරේ දී වාර්ෂික සාමාන්‍ය පදනම මත මධ්‍යස්ථ වශයෙන් ඉහළ ගිය නමුත් ලක්ෂ්‍යමය පදනම මත වඩා තීව්‍ර ඉහළ යෑමක් දැක්වීය.** තොග මිල දර්ශකය වාර්ෂික සාමාන්‍ය පදනම මත ජනවාරි මස පැවති සියයට 8 සිට නොකඩවා අඩු වෙමින් අගෝස්තු මාසයේ දී සියයට සෘණ 0.4 ක් වාර්තා කළ නමුත් ඉන්පසු එම උපනතිය ප්‍රතිවිරුද්ධ දෙසට හැරෙමින් දෙසැම්බර් මස වනවිට සියයට 3.5 දක්වා ක්‍රමයෙන් ඉහළ නැගිණි. තොග මිල දර්ශකයෙහි ලක්ෂ්‍යමය වෙනස ජනවාරි මස පැවති සියයට සෘණ 9.9 සිට පෙබරවාරි මාසයේ දී සියයට සෘණ 10.2 දක්වා පහත වැටුණු අතර, ඉන්පසු වඩා ඉහළ වර්ධන පථයක් ඔස්සේ ඉහළ යමින් ජූලි මාසයේ දී සියයට 9.2 ක් වාර්තා කොට, අගෝස්තු මාසයේ දී සියයට 7.8 ක් දක්වා අඩු වී එතැන් සිට වැඩි වී දෙසැම්බර් මාසයේ දී සියයට 13.8 ක් වාර්තා කළේය. ඛනිජ තෙල් නිෂ්පාදන සහ ආහාර යන උප දර්ශකයන්ගේ ඉහළ යාම මේ සඳහා හේතු විය.

**සමස්ත දර්ශක පැසෙන් සියයට 67.8 ක බරතැබුමක් සහිත ආහාර උප දර්ශකය, තොග මිල දර්ශකය තුළ ප්‍රමුඛත්වය ගනී.** 2012 වසරේ දී ආහාර උප දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය සියයට 0.7 කින් පහත වැටිණි.

රසායන හා රසායනික නිෂ්පාදන සහ විවිධ උප දර්ශක හැරුණු විට අනෙකුත් සියලුම උප දර්ශකයන් 2012 වසරේ දී, වාර්ෂික සාමාන්‍ය පදනම මත ඉහළ යාමක් වාර්තා කළේය. 2012 වසරේ දී වැඩිම වාර්ෂික සාමාන්‍ය ඉහළ යාම වන සියයට 40.4 ඛනිජ තෙල් නිෂ්පාදන උප දර්ශකය වාර්තා කළේය. තොග මිල දර්ශකයෙහි අංශ අනුව වර්ගීකරණය සැලකීමේ දී දේශීය සහ ආනයන අංශයන් වාර්ෂික සාමාන්‍ය පදනම මත පිළිවෙළින් සියයට 4.8 කින් හා සියයට 22.4 කින් ඉහළ නැගුණු අතර, අපනයන කාණ්ඩය සියයට 7.7 කින් පහත වැටිණි. තිරිඟු පිටි, ආනයනික සහල්, තිරිඟු ඇට, උම්බලකඩ, ඩීසල්, පෙට්‍රල් සහ භූමිතෙල්වල මිල ගණන් වැඩිවීම ආනයන කාණ්ඩයෙහි සැලකිය යුතු ඉහළ යාමකට දායක වූ අතර, පොල්, පොල් තෙල් සහ රබර් දුම් ගැසූ දාර රොටී 1 (RSS 1) ආදියෙහි මිල පහත වැටීම, අපනයන කාණ්ඩයේ සෘණාත්මක වර්ධනයට දායක විය. තොග මිල දර්ශකයෙහි අවසාන පරිභෝජනය මත වර්ගීකරණය අනුව, පරිභෝජන, අතරමැදි සහ ආයෝජන යන කාණ්ඩ තුනෙහිම මිල ගණන් වසර අවසානයේ දී වාර්ෂික සාමාන්‍ය පදනම මත පිළිවෙළින්, සියයට 0.5 කින්, සියයට 10 කින් සහ සියයට 16.1 කින් ඉහළ ගියේය. තිරිඟු පිටි, ආනයනික සහල්, තිරිඟු ඇට, ටයර්, ඩීසල්, පෙට්‍රල් සහ භූමිතෙල්වල මිල ඉහළ යාම අතර මැදි කාණ්ඩයෙහි ඉහළ නැගීමට විශාල වශයෙන් දායක වුණු අතර, දඟර වානේ, වතුර පොම්ප, ගඩොල්, මහන මැෂින් සහ ශීතකරණ මිල ඉහළ යාම ආයෝජන අංශයේ ඉහළ නැගීම කෙරෙහි හේතු විය.

### දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

**දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය මගින් මැන දැක්වෙන පරිදි ආර්ථිකයේ සමස්ත මිල වෙනස්වීම 2011 වසරේ පැවති සියයට 7.9 සමග සසඳන විට 2012 වසරේ දී සියයට 8.9 ක් දක්වා ඉහළ ගියේය.** ආර්ථිකයේ ප්‍රධාන අංශ තුන අතුරින් පසුගිය වසරේ අඩුම උද්ධමන අනුපාතිකයක් සටහන් කළ කර්මාන්ත අංශය 2012 වසරේ දී සියයට 10.6 ක ඉහළම අනුපාතිකය වාර්තා කළේය. කර්මාන්ත අංශය තුළ, පතල් සහ කැණීම්; නිෂ්පාදන කර්මාන්ත; විදුලිය, ගෑස් හා ජලය; සහ ඉදිකිරීම් යන උප අංශ හතරම මෙම ඉහළ යාම කෙරෙහි දායක විය. එමෙන්ම තොග හා සිල්ලර වෙළෙඳාම; හෝටල් සහ ආපනශාලා; ප්‍රවාහනය සහ සන්නිවේදනය; බැංකු, රක්ෂණ සහ දේපල වෙළෙඳාම්; නිවාස අයිතිය; රාජ්‍ය සේවා; සහ පෞද්ගලික සේවා යන සේවා අංශයේ සියලුම උප අංශයන්හි මිල ගණන් ද 2012 වසරේ දී ඉහළ නැගුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, සමස්ත සේවා අංශය සියයට 9.7 කින් ඉහළ ගියේය. මීට වෙනස්ව යමින්, කෘෂිකර්මාන්ත අංශය 2012 වසරේ දී නොවෙනස්ව පැවතිණි. 2012 වසරේ දී ධීවර උප අංශය සියයට 13.1 ක ඉහළ යාමක් වාර්තා කළ ද, කෘෂිකර්මය, පශු සම්පත් සහ දැව ආදී වන ද්‍රව්‍ය යන උප අංශයෙහි සිදු වූ සියයට 2.3 ක පහළ යාම මගින් එය මුළුමනින්ම පියවෙන ලදී.

**4.4 සංඛ්‍යා සටහන** දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

| අංශය | දර්ශකය | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 (අ) | 2012 (ආ) | 2011/10 (අ) | 2012/11 (ආ) |
| කෘෂිකර්මාන්ත | 377.1 | 410.3 | 410.2 | 8.8 | 0.0 |
| කර්මාන්ත | 342.4 | 368.2 | 407.3 | 7.5 | 10.6 |
| සේවා | 327.6 | 353.7 | 388.1 | 8.0 | 9.7 |
| **ද.දේ.නි.** | **338.9** | **365.5** | **398.0** | **7.9** | **8.9** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## 4.3 වැටුප්

2012 වසරේ දී **රාජ්‍ය හා පෞද්ගලික යන දෙයංශයෙහිම සේවකයන්ගේ නාමික වැටුප් ඉහළ ගිය අතර, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ පමණක් මූර්ත වැටුප්වල ඉහළ යාමක් වාර්තා විය.** පඩි පාලක සභා මගින් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයෙහි සේවකයන්ගේ නාමික වැටුප් සහ මූර්ත වැටුප්වල වැඩිවීම සැලකිය යුතු අගයක් ගැනිණි. තවද, ශ්‍රම වෙළෙඳපොළ තුළ ඉල්ලුම් සහ සැපයුම් සාධක මගින් නිදහසේ වැටුප් තීරණය වන අවිධිමත් පෞද්ගලික අංශයෙහි සේවකයන්ගේ වැටුප් නාමික හා මූර්ත යන දෙයාකාරයෙන්ම ඉහළ ගිය අතර, විශේෂයෙන්ම, අවිධිමත් පෞද්ගලික අංශයෙහි සේවකයන්ගේ නාමික වැටුප්වල සැලකිය යුතු වැඩිවීමක් 2012 වසර තුළ පෙන්නුම් කෙරිණි. ඒ අතර, රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා ලබාදුන් මූලික වැටුපෙන් සියයට 10 ක් වූ විශ්‍රාම වැටුපට හිමිකම් නොලබන විශේෂ දීමනාව හේතු කොටගෙන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් ඉහළ නැගිණි. කෙසේ වුවද, 2012 වසරේ දී නාමික වැටුප් වැඩිවීමට වඩා වැඩි ප්‍රමාණයකින් මිල මට්ටම ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් සියයට 0.6 ක සුළු අඩුවීමක් වාර්තා කළේය.

### රාජ්‍ය අංශයේ වැටුප්

**2012 වසරේ දී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක ඉහළ නැගිණි.** 2012 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා ලබා දුන් මූලික වැටුපෙන් සියයට 10 ක් වූ

**4.5 සංඛ්‍යා සටහන**

**වැටුප් ප්‍රමාණ දර්ශක**

(1978 දෙසැම්බර් = 100)

| සේවක කාණ්ඩ | දර්ශකය | | | | | | ප්‍රතිශත වෙනස | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නාමික | | | මූර්ත (අ) | | | නාමික | | | මූර්ත (අ) | | |
| | 2010 | 2011 | 2012 (ආ) | 2010 | 2011 | 2012 (ආ) | 2010 | 2011 | 2012 (ආ) | 2010 | 2011 | 2012 (ආ) |
| 1. රජයේ සේවකයන් | | | | | | | | | | | | |
| මධ්‍යම රජයේ සේවකයන් | 4,651.6 | 4,964.5 | 5,304.7 | 154.7 | 154.7 | 153.8 | 3.3 | 6.7 | 6.9 | -2.7 | 0.0 | -0.6 |
| විධායක නොවන | 4,210.4 | 4,490.1 | 4,803.6 | 140.1 | 139.9 | 139.3 | 3.1 | 6.6 | 7.0 | -2.8 | -0.1 | -0.5 |
| සුළු සේවකයන් | 5,116.1 | 5,465.1 | 5,831.8 | 170.2 | 170.3 | 169.1 | 3.5 | 6.8 | 6.7 | -2.5 | 0.1 | -0.7 |
| රජයේ පාසල් ගුරුවරුන් | 3,321.7 | 3,576.1 | 3,821.8 | 110.5 | 111.5 | 110.8 | 3.3 | 7.7 | 6.9 | -2.7 | 0.9 | -0.6 |
| 2. පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | | | | | | | | | | | | |
| සියලුම පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | 2,865.3 | 2,996.1 | 3,662.0 | 95.3 | 93.3 | 106.2 | 32.0 | 4.6 | 22.2 | 24.3 | -2.0 | 13.8 |
| කෘෂිකර්මාන්තයෙහි නියැලුණු කම්කරුවන් | 3,327.6 | 3,427.2 | 4,433.0 | 110.7 | 106.8 | 128.6 | 41.6 | 3.0 | 29.3 | 33.4 | -3.6 | 20.4 |
| කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියැලුණු කම්කරුවන් | 2,199.0 | 2,402.1 | 2,402.1 | 73.1 | 74.9 | 69.7 | 7.1 | 9.2 | 0.0 | 0.7 | 2.4 | -6.9 |
| සේවා අංශයෙහි කම්කරුවන් | 1,673.3 | 1,851.8 | 1,851.8 | 55.6 | 57.7 | 53.7 | 8.2 | 10.7 | 0.0 | 1.8 | 3.8 | -6.9 |

(අ) මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක, කො.පා.මි.ද. (2006/07=100) පදනම් කොටගෙන ගලපා ඇත.
(ආ) තාවකාලික

මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

විශ්‍රාම වැටුපට හිමිකම් නොලබන විශේෂ දීමනාව, මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. 2011 ජනවාරි මාසයේ දී රුපියල් 5,850 දක්වා ඉහළ නැංවූ රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාව, 2012 වසර තුළ දී නොවෙනස්ව පැවතුණි. 2011 වසරේ දී සියයට 6.6-7.7 පරාසයක සිදු වූ වැඩිවීම හා සැසඳීමේ දී 2012 වසරේ විධායක නොවන ශ්‍රේණිවල නිලධාරීන්, සුළු සේවකයන් හා රජයේ පාසල් ගුරුවරුන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක පිළිවෙළින්, සියයට 7, සියයට 6.7 සහ සියයට 6.9 ක් ලෙස ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මධ්‍යම රජයේ සේවකයන්ගේ සමස්ත නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය 2011 වසරේ වාර්තා වූ සියයට 6.7 හා සැසඳීමේ දී 2012 වසරේ දී සාමාන්‍ය වශයෙන්, සියයට 6.9 කින් ඉහළ ගියේය.

නාමික වැටුප් උද්ධමනය සඳහා ගැලපුම් කළ විට, **රාජ්‍ය අංශයේ සියලුම කාණ්ඩවල සේවකයන්ගේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක 2012 වසරේ දී සුළු වශයෙන් පහළ යාමක් වාර්තා කළේය.** විධායක නොවන ශ්‍රේණිවල නිලධාරීන්, සුළු සේවකයන් සහ රජයේ පාසල් ගුරුවරුන්ගේ මූර්ත වැටුප් 2012 වසරේ දී පිළිවෙළින් සියයට 0.5, සියයට 0.7 සහ සියයට 0.6 කින් පහත වැටුණි. 2011 වසරේ දී සුළු සේවකයන් සහ රජයේ පාසල් ගුරුවරුන් පමණක් පිළිවෙළින් සියයට 0.1 ක සහ සියයට 0.9 ක මූර්ත වැටුප් වැඩිවීමක් භුක්තිවිඳින ලද අතර, විධායක නොවන ශ්‍රේණිවල නිලධාරීන්ගේ මූර්ත වැටුප් සියයට 0.1 කින් පහත වැටුණි. ඉහතින් සඳහන් කළ වැටුප් වර්ධනයන්හි ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස, රජයේ සේවකයන්ගේ සමස්ත මූර්ත වැටුප් දර්ශකය 2012 වසරේ දී සියයට 0.6 කින් පහත වැටුණි.

### විධිමත් පෞද්ගලික අංශයේ වැටුප්

**අවම වැටුප් ප්‍රමාණ දර්ශක මගින් මනිනු ලබන සංවිධිත පෞද්ගලික අංශයේ නාමික වැටුප් පෙර වසරේ දී වාර්තා වූ සියයට 4.6 ක වර්ධනය හා සසඳන විට 2012 වසරේ දී සියයට 22.2 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.** 2011 හා 2012 වර්ෂයන්හි ලබාදුන් වැටුප් සංශෝධන කෘෂිකර්මාන්ත අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය සියයට 29.3 කින් ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. 2011 වසරේ දී මෙම වර්ධනය සියයට 3 ක් විය. ඒ අනුව, තේ වැවිලි හා නිෂ්පාදන, රබර් වැවිලි හා නිෂ්පාදන සහ පොල් වැවිලි යන අංශයන්හි සේවකයන්ගේ දෛනික වැටුප් පිළිවෙළින් 2011 දෙසැම්බර් මාසයේ දී රුපියල් 380 දක්වා සියයට 33.3 කින් ද 2012 පෙබරවාරි මාසයේ දී රුපියල් 360 දක්වා සියයට 16.1 කින් ද ඉහළ ගියේය. මේ අතර, විධිමත් පෞද්ගලික අංශයේ අනෙක් කාණ්ඩ දෙක වන කර්මාන්ත හා වාණිජ සහ සේවා යන අංශයන්හි අවම වැටුප් ප්‍රමාණ දර්ශක වසර තුළ දී නොවෙනස්ව පැවතුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, කෘෂිකර්මාන්ත අංශයෙහි වැටුප් ඉහළ යාම හේතුවෙන් සමස්ත අවම වැටුප් ප්‍රමාණ දර්ශකය මත ඇති වූ ධනාත්මක බලපෑම තරමක් දුරට අවම විය.

2012 වර්ෂයේ දී **විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්, විශේෂයෙන්ම, කෘෂිකර්මාන්ත අංශයේ සේවකයන් සැලකිය යුතු මූර්ත වැටුප් ඉහළ යාමක් භුක්තිවිඳින ලද අතර, කර්මාන්ත සහ වාණිජ හා සේවා යන අංශවල සේවකයන්ගේ මූර්ත වැටුප් පහත වැටුණි.** ඒ අනුව, 2012 දී කෘෂිකර්මාන්ත අංශයේ මූර්ත වැටුප් සියයට 20.4 කින් ඉහළ ගිය අතර, කර්මාන්ත හා වාණිජ සහ සේවා යන අංශයන්හි මූර්ත වැටුප් සියයට 6.9 බැගින් අඩු විය.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, විධිමත් පෞද්ගලික අංශයෙහි සමස්ත මූර්ත වැටුප් දර්ශකය පෙර වසර හා සැසඳීමේ දී සියයට 13.8 ක වැඩිවීමක් වාර්තා කළේය.

## අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප්

**2012 වසර තුළ දී අවිධිමත් පෞද්ගලික අංශයේ සාමාන්‍ය දෛනික වැටුප් නාමික හා මූර්ත ලෙස, විවිධ අනුපාතයන්ගෙන් ඉහළ ගියේය.** රාජ්‍ය අංශයට හා විධිමත් පෞද්ගලික අංශයට අයත් නොවන සියලුම සේවකයන්ගෙන් අවිධිමත් පෞද්ගලික අංශය සමන්විත වේ. අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප්, ආර්ථිකයේ පවතින ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන් හා එම කම්කරුවන් බලාපොරොත්තු වන අවම වැටුප් මට්ටම් මත තීරණය වේ. මෙම අංශය යටතට ගැනෙන කෘෂිකර්මාන්තය හා ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තයන්ට අදාළ වැටුප් පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ යටතේ එක්රැස් කරනු ලැබේ.

**2012 වසරේ දී අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් නාමික වශයෙන් සියයට 14.1 ක සාමාන්‍ය අනුපාතයකින් ඉහළ ගියේය.** ඒ අනුව, 2012 වසරේ දී කෘෂිකර්මාන්ත හා ඉදිකිරීම් යන අංශවල සේවකයන්ගේ නාමික වැටුප්වල ඉහළ යාම පිළිවෙළින් සියයට 14.4 ක් හා සියයට 12.5 ක් විය. 2012 වසරේ දී කෘෂිකර්මාන්ත අංශයෙහි රබර්, තේ, වී සහ පොල් යන උප කාණ්ඩවල සාමාන්‍ය දෛනික වැටුප් පිළිවෙළින් සියයට 15.6 කින්, සියයට 14.3 කින්, සියයට 14.3 කින් සහ සියයට 13.1 කින් වැඩි විය. පොල් උප කාණ්ඩයේ හැරුණු විට රබර්, තේ සහ වී යන උප කාණ්ඩවල නාමික වැටුප් වැඩිවීම් පෙර වසරට සාපේක්ෂව වඩා ඉහළ මට්ටමක පැවතිණි. 2012 වසරේ දී තේ සහ රබර් නිෂ්පාදනයන්හි නිෂ්පාදන ප්‍රමාණය, ඒකක මිල සහ අපනයන වටිනාකම හා ප්‍රමාණය පහළ ගිය ද, ශ්‍රමිකයන්ට ඉහළ වැටුපක් ගෙවන ලද්දේ, අඩු ශ්‍රම සැපයුම හේතු කොට ගෙන වැටුප් මත ඇති වූ පීඩනය නිසා විය හැකිය. වසර තුළ දී, පොල් නිෂ්පාදනයේ ඉහළ යාමට අනුරූපව සේවකයන් විසින් ඉහළ වැටුප් ඉල්ලීම, පොල් උප කාණ්ඩයෙහි දෛනික වැටුප් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූවා විය හැකිය. 2012 දී වී නිෂ්පාදනයේ සිදු වූ සුළු වැඩිවීම, වී උප කාණ්ඩයේ ද ශ්‍රමික වැටුප් වැඩි වීමට හේතු විය. තවද, විධිමත් පෞද්ගලික අංශයෙහි කෘෂිකර්මාන්ත උප අංශයේ ශ්‍රමිකයන්ගේ අවම වැටුපෙහි තියුණු ඉහළ යාම අවිධිමත් පෞද්ගලික අංශයෙහි කෘෂිකාර්මාන්ත

**4.6 සංඛ්‍යා සටහන**

**අංශය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් (අ)**

| අංශය | වාර්ෂික සාමාන්‍යය (රු.) | | | ප්‍රතිශත වෙනස: නාමික | | ප්‍රතිශත වෙනස: මූර්ත (ඇ) | |
|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 (ආ) | 2011 | 2012 (ආ) | 2011 | 2012 (ආ) |
| 1. කෘෂිකර්මාන්ත අංශය | | | | | | | |
| තේ | | | | | | | |
| පුරුෂ | 545 | 617 | 691 | 13.2 | 12.0 | 6.0 | 4.1 |
| ස්ත්‍රී | 396 | 438 | 512 | 10.6 | 16.9 | 3.6 | 8.7 |
| රබර් | | | | | | | |
| පුරුෂ | 588 | 658 | 741 | 11.9 | 12.6 | 4.8 | 4.7 |
| ස්ත්‍රී | 474 | 490 | 585 | 3.4 | 19.4 | -3.2 | 11.0 |
| පොල් (ඈ) | | | | | | | |
| පුරුෂ | 700 | 783 | 887 | 11.9 | 13.3 | 4.8 | 5.4 |
| වී | | | | | | | |
| පුරුෂ | 658 | 704 | 787 | 7.0 | 11.8 | 0.2 | 4.0 |
| ස්ත්‍රී | 454 | 530 | 599 | 16.7 | 13.0 | 9.3 | 5.1 |
| 2. ඉදිකිරීම් අංශය (ඈ) | | | | | | | |
| වඩුකාර්මික | | | | | | | |
| වඩුකාර්මික - පිරිමි | 1,000 | 1,115 | 1,248 | 11.5 | 11.9 | 4.4 | 4.1 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරුවන් - පිරිමි | 656 | 729 | 824 | 11.1 | 13.0 | 4.1 | 5.1 |
| පෙදරේරු | | | | | | | |
| පෙදරේරු - පිරිමි | 994 | 1,093 | 1,216 | 10.0 | 11.2 | 3.0 | 3.5 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරුවන් - පිරිමි | 667 | 729 | 823 | 9.3 | 12.9 | 2.4 | 5.0 |

(අ) වැටුප් විස්තර, දීප ව්‍යාපත් දත්ත රැස් කිරීමේ වැඩසටහන මගින් ආවරණය වන මධ්‍යස්ථාන 102 ක මාසික වැටුප් පදනම්කොට ගෙන සකස් කර ඇත.
(ආ) තාවකාලික
(ඇ) මූර්ත වැටුප්, කො.පා.මි.ද. (2006/07=100) පදනම් කොටගෙන ගලපා ඇත.
(ඈ) මෙම අංශවල කාන්තා සහභාගීත්වය අවම මට්ටමක පවතී.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

උප අංශයේ වැටුප් වැඩිවීමට බලපෑමක් ඇති කරන්නට ඇත. ඉදිකිරීම් අංශයෙහි, වඩු කාර්මිකයන්ගේ සහ පෙදරේරුවන්ගේ දෛනික වැටුප් 2012 වසරේ දී පිළිවෙළින් සියයට 12.7 ක හා සියයට 12.3 ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. ඉදිකිරීම් කර්මාන්තවල සේවකයන් සඳහා අඛණ්ඩව පැවති ඉහළ ඉල්ලුම සහ එවැනි සේවකයින් විදේශ රැකියා සඳහා පිටත්වයාම් නිසා ඇති වූ සේවක හිඟය මෙම ඉහළ යාමට හේතු විය.

**කෘෂිකර්මාන්ත සහ ඉදිකිරීම් යන අංශවල සියලුම උප කාණ්ඩයන්හි මූර්ත වැටුප් ඉහළ යාමක් 2012 වසර තුළ දී වාර්තා විය.** ඒ අනුව, කෘෂිකර්මාන්ත අංශයේ රබර්, තේ, වී සහ පොල් යන උප කාණ්ඩවල සාමාන්‍ය දෛනික මූර්ත වැටුප් පිළිවෙළින් සියයට 7.5 කින්, සියයට 6.3 කින්, සියයට 6.3 කින් සහ සියයට 5.2 කින් වැඩි විය. ඉදිකිරීම් අංශයෙහි වඩු කර්මාන්ත සහ පෙදරේරු යන උප අංශවල සාමාන්‍ය දෛනික මූර්ත වැටුප්වල පිළිවෙළින් සියයට 4.8 ක සහ සියයට 4.5 ක ඉහළ යාමක් වාර්තා විය. සමස්තයක් වශයෙන්, කෘෂිකර්මාන්ත හා ඉදිකිරීම් යන අංශ දෙකම 2012 වසරේ දී පිළිවෙළින් සියයට 6.4 ක සහ සියයට 4.7 ක සාපේක්ෂව වඩා ඉහළ මූර්ත වැටුප් වැඩිවීමක් වාර්තා කළේය. ඒ අනුව, සාමාන්‍ය වශයෙන් ගත්විට, අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ දෛනික මූර්ත වැටුප්, 2012 වසරේ දී සියයට 6.2 කින් ඉහළ නැගිණි. පෙර වසරේ දී මෙම වැඩිවීම සියයට 4.6 ක් විය.

## 4.4 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

### ජනගහනය

**2012 වසරේ මැදි වසර ජනගහනය මිලියන 20.328 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.** මුළු ජනගහනයෙන් සියයට 51.5 ක් ස්ත්‍රීන්ගෙන් සමන්විත වූ අතර, සියයට 48.5 ක් පුරුෂයන්ගෙන් සමන්විත විය. මුළු ජනගහනයෙන් හතරෙන් එකකට වැඩි ප්‍රමාණයක් බස්නාහිර පළාතෙහි (සියයට 28.7) ජීවත් වූ අතර, අඩුම ජනගහනයකින් යුතු වූයේ උතුරු පළාතයි (සියයට 5.2). බස්නාහිර පළාතෙහි කොළඹ සහ ගම්පහ යන එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය මිලියන දෙක ඉක්මවූ අතර, එය එම පළාතෙහි ජනගහනයෙන් සියයට 79.1 ක් සඳහා දායක විය. මෙයට ප්‍රතිවිරුද්ධව, ලක්ෂයකට අඩු ජනගහනයකින් යුතු වූ මුලතිව් (92,114) සහ මන්නාරම (99,528) යන දිස්ත්‍රික්කවලින් අඩුම ජනගහනය වාර්තා විය. කුරුණෑගල, මහනුවර, කළුතර, රත්නපුර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක පහ අතුරෙන් සෑම දිස්ත්‍රික්කයක්ම මිලියනයකට වඩා වැඩි ජනගහනයක්

**4.7 සංඛ්‍යා සටහන — දිස්ත්‍රික්ක මට්ටමෙන් ජනගහනය සහ ජන ඝනත්වය (අ)**

| දිස්ත්‍රික්කය | 2011 (ආ) | 2012 (ඇ) | |
|---|---|---|---|
| | | ජනගහනය | ජන ඝනත්වය |
| කොළඹ | 2,584,413 | 2,315,593 | 3,425 |
| ගම්පහ | 2,191,190 | 2,300,271 | 1,715 |
| කළුතර | 1,143,778 | 1,220,381 | 774 |
| මහනුවර | 1,447,292 | 1,374,672 | 717 |
| මාතලේ | 503,907 | 484,201 | 248 |
| නුවරඑළිය | 767,444 | 709,564 | 416 |
| ගාල්ල | 1,095,718 | 1,061,449 | 656 |
| මාතර | 847,438 | 811,884 | 639 |
| හම්බන්තොට | 576,171 | 599,170 | 240 |
| යාපනය | 617,117 | 584,704 | 629 |
| මන්නාරම | 105,336 | 99,528 | 53 |
| වව්නියාව | 177,301 | 172,064 | 92 |
| මුලතිව් | 144,160 | 92,144 | 38 |
| කිලිනොච්චිය | 159,862 | 113,545 | 94 |
| මඩකලපුව | 549,834 | 526,940 | 202 |
| අම්පාර | 653,985 | 650,913 | 154 |
| ත්‍රිකුණාමලය | 379,942 | 379,702 | 150 |
| කුරුණෑගල | 1,576,669 | 1,615,554 | 349 |
| පුත්තලම | 788,510 | 762,764 | 265 |
| අනුරාධපුරය | 840,129 | 859,238 | 129 |
| පොළොන්නරුව | 414,808 | 404,435 | 131 |
| බදුල්ල | 897,342 | 814,670 | 288 |
| මොණරාගල | 445,090 | 449,889 | 82 |
| රත්නපුරය | 1,138,840 | 1,085,754 | 336 |
| කෑගල්ල | 822,527 | 839,014 | 498 |
| **එකතුව** | **20,868,803** | **20,328,043** | **324** |

මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

(ආ) 2011 මැදි වසර ජනගනය, දිස්ත්‍රික්ක 18ක් ආවරණය වන පරිදි 2001 දී පවත් වන ලද ජන හා නිවාස සංගණනය ද, ඉතිරි දිස්ත්‍රික්ක 7 සඳහා ඇස්තමෙන්තු ද, 2010 ජූලි 01 - 2011 ජූනි 30 දක්වා කාලපරිච්ඡේදය ඇතුළත ජනගහනයේ ස්වභාවික වර්ධනය හා ශුද්ධ සංක්‍රමණ ද මත පදනම්ව ඇස්තමේන්තු කර ඇත.


(ඇ) 2012 මැදි වසර ජනගහනය, සමස්ත දිවයිනම අවරණය වන පරිදි 2012 පෙබරවාරි සහ මාර්තු මාසයන්හි පවත්වන ලද ජන හා නිවාස සංගණනය සහ 2012 මාර්තු 20 - 2012 ජූනි 30 දක්වා කාලපරිච්ඡේදය ඇතුළත ජනගහනයේ ස්වභාවික වර්ධනය සහ ශුද්ධ සංක්‍රමණ ද මත පදනම්ව ඇස්තමේන්තු කර ඇත.

වාර්තා කළේය. 2012 වසරේ දී රට තුළට සංක්‍රමණය වීමේ සහ රටින් පිටතට සංක්‍රමණය වීමේ සංඛ්‍යාව පිළිවෙළින් මිලියන 2.496 සහ මිලියන 2.548 ක් ලෙස වාර්තා වූ අතර, ශුද්ධ සංක්‍රමණික අනුපාතිකය සියයට ඍණ 2.6 ක් විය. 2012 වසරේ දී ජන ඝනත්වය, එනම් රටෙහි වර්ග කිලෝ මීටරයක් තුළට ගැනෙන පුද්ගලයන් සංඛ්‍යාව 324 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කොළඹ දිස්ත්‍රික්කයෙහි ජන ඝනත්වය 3,425 ක් වූ අතර, මුලතිව්හි එය 38 ක් විය.

## විශේෂ සටහන 7 ශ්‍රී ලංකා ජනගහනයේ වයස් ව්‍යුහ සංක්‍රාන්තියෙන් ගම්‍ය වන ආර්ථික තත්ත්වයන්

ජන හා නිවාස සංගණනය 2011[1] (2011 ජන සංගණනය), 1981 ජන සංගණනයෙන් වසර 30 කට පසුව මුළු දිවයිනම ආවරණය වන පරිදි පවත්වන ලදී. 2011 ජන සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ ජනගහනය 20,263,723 ක් වූ අතර, 1981-2001 අන්තර් සංගණන කාලපරාසය තුළ පැවති සියයට 1.2 ක වාර්ෂික ජනගහන වර්ධන වේගය, 2001-2012 අන්තර් සංගණන කාලපරාසය වනවිට සියයට 0.7 ක් දක්වා අඩු වී ඇත. මෙයට ප්‍රධාන හේතු වශයෙන් දැක්විය හැකි වන්නේ ශ්‍රී ලංකාවේ ජනගහනයේ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය පිළිබිඹු කරමින් උපත් අනුපාතිකයේ දක්නට ලැබෙන අඩුවීම, පහළ අගයකින් යුතු මරණ අනුපාතිකය සහ ජාත්‍යන්තර සංක්‍රමණයන්හි දක්නට ලැබෙන වර්ධනයන්ය.

**රූප සටහන වි.ස. 7.1 වාර්ෂික ජනගහනය හා ජනගහන වර්ධන වේගය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා ජනගහනයේ වයස් ව්‍යුහ සංක්‍රාන්තිය

වයස් ව්‍යුහ සංක්‍රාන්තිය, ප්‍රජා විද්‍යා සංක්‍රාන්තියේ පසු ප්‍රතිඵලයක් වන අතර, මෙහිදී රටක තරුණ ජනගහනයක් වයස්ගත ජනගහනයක් බවට පරිවර්තනය වේ. වයස් ව්‍යුහ සංක්‍රාන්තිය ඉතා පුළුල් අදියර තුනක් පසු කරමින් විකාශනය වන අතර, එම එක් එක් අදියරයන්හි දී විශේෂිත වූ එක් වයස් කාණ්ඩයක ජනගහනයේ වර්ධනයක් පෙන්නුම් කරයි. වයස් ව්‍යුහ සංක්‍රාන්තියේ මූලික අවස්ථාවේ දී බිළිඳු මර්ත්‍යතා අනුපාතිකයේ අඩුවීම හා සඵලතා අනුපාතිකයේ වැඩිවීම හේතුවෙන් ළමා ජනගහනයේ වැඩිවීමක් නිරීක්ෂණය කළ හැකිය. වයස් ව්‍යුහ සංක්‍රාන්තියේ දෙවන අදියරේ දී කාලයාගේ ඇවෑමෙන් මෙම ළමා ජනගහනය වැඩ කරන ජනගහනයට එක් වීමේ ප්‍රතිඵලයක් ලෙස රැකියා කිරීමට සුදුසු වයස් කාණ්ඩයට අයත් ජනගහනයේ වැඩි වීමක් සිදුවේ. එමෙන්ම මෙම අවස්ථාවේ දී සඵලතා අනුපාතිකයේ සහ මර්ත්‍යතා අනුපාතිකයේ අඩුවීමක් ද නිරීක්ෂණය කළ හැකිය. වයස් ව්‍යුහ සංක්‍රාන්තියේ මීළඟ අදියර වන්නේ අපේක්ෂිත ආයු කාලයේ වැඩිවීමත් සමග මහලු වයස් කාණ්ඩවලට අයත් ජනගහනයේ සිදුවන ඉහළ යාමයි (Navaneetham and Dharmalingam, 2012). 1981 සහ 2011 ජන සංගණන ප්‍රතිඵල සැසඳීමේ දී පසුගිය වසර 30 ක කාලපරාසය තුළ දී ජනගහනයේ වයස් ව්‍යුහයේ සැලකිය යුතු වෙනස්වීම් පෙන්නුම් කරන අතර, එමගින් මෑත කාලයේ දී සමහරක් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල්වලින් දක්නට ලැබුණු ජනගහනයේ වියපත් වීම ශ්‍රී ලංකාවේ ද පෙන්නුම් කරන බවක් දක්නට ඇත. පසුගිය කාලපරිච්ඡේදය තුළ දී දක්නට ලැබුණු අපේක්ෂිත ආයු කාලයේ වැඩිවීමත්, සඵලතා අනුපාතිකයේ අඩු වීමත් මෙම සංසිද්ධිය සඳහා හේතු වී ඇති අතර, මෙමගින් ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජයීය සංවර්ධනයන් විදහා පායි.

### යැපීම් අනුපාතිකයන්

වයස් ව්‍යුහ සංක්‍රාන්තියට අනුව, 1981 ජන සංගණනයේ දී සියයට 35.2 ක් ලෙස වාර්තා වූ ශ්‍රී ලංකාවේ ළමා ජනගහනය (අවුරුදු 15 ට අඩු) 2011 ජන සංගණනයේ දී සියයට 25.8 ක් දක්වා ඉතා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇති අතර, 2011 ජන සංගණනයේ දී සියයට 12.2 ක් ලෙස වාර්තා වූ මහලු ජනගහනය (අවුරුදු 60 ට වැඩි) 1981 දී වාර්තා වූ සියයට 6.6 ක අගය සමග සැසඳීමේ දී දෙගුණයක් පමණ වී ඇති බව පෙන්නුම් කෙරේ. කෙසේ වුවද, වයස් ව්‍යුහයේ වඩා කැපී පෙනෙන කාණ්ඩය වන වැඩකරන ජනගහනය, 1981 ජන සංගණනයේ දී සියයට 58.2 ක් වූ අතර, 2011 ජන සංගණනයේ දී සියයට 62 ක් දක්වා වැඩිවී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ළමා හා


**සංඛ්‍යා සටහන වි.ස. 7.1 වයස් සංයුතිය හා යැපීම් අනුපාත**

| වයස් කාණ්ඩය | 1981 ජන සංගණනය | 2011 ජන සංගණනය |
|---|---|---|
| 15 ට අඩු | 35.2 | 25.8 |
| 15 - 59 | 58.2 | 62.0 |
| 60 හා ඊට වැඩි | 6.6 | 12.2 |
| මුළු යැපීම් අනුපාතය | 71.8 | 61.3 |
| ළමා යැපීම් අනුපාතය | 60.5 | 41.6 |
| වයස්ගත යැපීම් අනුපාතය | 11.3 | 19.7 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

[1] 2012 පෙබරවාරි සහ මාර්තු මාසවලදී සංගණන කටයුතු සිදුකරන ලදී. මෙම විශ්ලේෂණය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත මූලික ප්‍රකාශන පදනම් කරගෙන ඇති නිසා මෙහි ප්‍රකාශිත දත්ත තාවකාලික වේ.

**රූප සටහන වි.ස. 7.2 ශ්‍රී ලංකාවේ ජනගහන වයස් ව්‍යුහය - 1981**





මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, මධ්‍ය වාර්ෂික ජනගහනය

වයස්ගත ජනගහනය වැඩකරන ජනගහනයේ අනුපාතයක් ලෙස සලකා ගණනය කරනු ලබන මුළු යැපීම් අනුපාතය, 1981 ජන සංගණනයේ දී වාර්තා වූ සියයට 71.8 ක සිට නවතම 2011 ජන සංගණනයේ දී සියයට 61.3 ක් දක්වා අඩු වී ඇති අතර, මෙයට ප්‍රධානතම හේතුව ලෙස ළමා ජනගහනයේ දක්නට ලැබුණු අඩුවීම දැක්විය හැකිය. මෙයින් අදහස් වනුයේ, එක් වයස්ගත පුද්ගලයෙකු සඳහා වැඩ කරන පුද්ගලයන් පස් දෙනෙකු ද, එක් යැපෙන්නෙකු (ළමා හා වයස්ගත) සඳහා වැඩකරන පුද්ගලයන් 1.6 ක් ද සිටිනා බවයි.

## ප්‍රජා විද්‍යාත්මක ප්‍රතිලාභ


එක්සත් ජාතීන්ගේ ජනගහන දෙපාර්තමේන්තුවේ නිර්වචනයට අනුව, ප්‍රජා විද්‍යාත්මක ප්‍රතිලාභ කාලපරිච්ඡේදය, ජනගහනයේ අවුරුදු 15 ට අඩු ජනගහනය සියයට 30 ට වඩා අඩු අගයකුත්, වයස 65 සහ ඊට වැඩි කාණ්ඩය සියයට 15 කට අඩු ප්‍රතිශතයකුත් ගන්නා සංක්‍රාන්ති සමයක් ලෙස හඳුන්වා දී ඇත (De Silva, 2012). එමෙන්ම, ජනගහන වර්ධන වේගයට

**රූප සටහන වි.ස. 7.4 ශ්‍රී ලංකාවේ වයස් සංයුතිය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**රූප සටහන වි.ස. 7.3 ශ්‍රී ලංකාවේ ජනගහන වයස් ව්‍යුහය - 2011**




මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, මධ්‍ය වාර්ෂික ජනගහනය (දත්ත තාවකාලික වේ)

සාපේක්ෂව ශ්‍රම බලකායේ වර්ධන වේගය වඩා වැඩි අගයක් ගන්නා අවස්ථාවේ දී ප්‍රජා විද්‍යාත්මක ප්‍රතිලාභ අත්පත් කර ගැනීමේ හැකියාව පවතී (Navaneetham and Dharmalingam, 2012)[2]. ප්‍රජා විද්‍යා සංක්‍රාන්තියේ ප්‍රථම ප්‍රතිලාභයේ ආරම්භය සහ නැතිවීයාම සිදුවනුයේ ජනගහනයේ වයස් ව්‍යුහයේ ඇතිවන වෙනස්කම්, ආර්ථිකයෙහි නිෂ්පාදන සහ පරිභෝජන ජීවන චක්‍රය සමඟ අන්‍යෝන්‍යව ක්‍රියාකිරීමේ දීය. ළමා හා වයස්ගත ජනගහනයේ පරිභෝජනය, ඔවුන් නිෂ්පාදනය කරන ප්‍රමාණයට වඩා වැඩි වන අතර, වැඩ කරන ජනගහනය සාමාන්‍යයෙන් ඔවුන් පරිභෝජනය කරන ප්‍රමාණයට වඩා නිෂ්පාදනය කරති (Mason). එමනිසා ජනගහනයෙන් වැඩි කොටසක් රැකියා කරන වයස් කාණ්ඩය තුළ දැඩි ඒකරාශී වීමක් දක්නට ලැබෙන රටවල් වලට ඉතා ඉහළ ඒක පුද්ගල ආදායම් මට්ටම් කරා ළඟා වීමේ නිසර්ග වාසියක් ඇත.

වයස් ව්‍යුහයේ ප්‍රවණතාවන් සලකන විට, වර්තමානයේ දී ශ්‍රී ලංකාව වැඩකරන වයස් සීමාවේ පසුවන කණ්ඩායම සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් ගන්නා ප්‍රජා විද්‍යා සංක්‍රාන්තියේ පළමු ප්‍රතිලාභය අත්විඳිමින් සිටින අතර, ඔවුන් ඵලදායීව යෙදවීම මගින් රටේ දළ දේශීය නිෂ්පාදිතය වැඩිදියුණු කරගත හැකිවනු ඇත. වයස්ගත ජනගහනය අවුරුදු 65 ට වඩා වැඩි පුද්ගලයන් ලෙස නිර්වචනය කළ විට, ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යා සංක්‍රාන්තියේ පළමු ප්‍රතිලාභය 1991 වසරේ දී පමණ ආරම්භ වූ අතර එය වසර 2030 දක්වා පවතිනු ඇතැයි බලාපොරොත්තු විය හැක. කෙසේ නමුත්, වයස්ගත ජනගහනය අවුරුදු 60 ට (ශ්‍රී ලංකාවේ අනිවාර්ය විශ්‍රාමික වයස් සීමාව) වඩා වැඩි පුද්ගලයන් ලෙස නිර්වචනය කළ විට, ප්‍රජා විද්‍යා සංක්‍රාන්තියේ පළමු ප්‍රතිලාභය වසර 2017 දක්වා පමණක් බලාපොරොත්තු විය හැක (De Silva, 2012). ප්‍රජා විද්‍යා

---

[2] ගිණුම්කරණ මූලධර්මවලට අනුව $g_y = g_z + (g_l - g_n)$, $g_y$ - ඒක පුද්ගල ආදායමේ වර්ධන වේගය, $g_z$- වැඩකරන පුද්ගලයකුගේ ඒක පුද්ගල ආදායමේ වර්ධන වේගය, $g_l$- ශ්‍රම බලකායේ වර්ධන වේගය, $g_n$- ජනගහනයේ වර්ධන වේගය.

සංක්‍රාන්තියේ ප්‍රතිලාභ යම්කිසි සීමාසහිත කාලයක් තුළ පමණක් ලබාගත හැකි නිසාත් එය ස්වසංසිද්ධ නොවන හා ගනු ලබන ප්‍රතිපත්ති මත යැපෙන්නක් වන නිසාත්, මෙම යැපීම් බර අඩු අවස්ථාව, වඩාත් ඵලදායී ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඉතා ඉක්මණින් ප්‍රයෝජනයට ගත යුතුව ඇත.

ප්‍රජා විද්‍යා සංක්‍රාන්තියේ පළමු ප්‍රතිලාභය අත්පත් කරගෙන ඇති රටවල් වඩාත් ස්ථාවර සාර්ව ආර්ථික වාතාවරණයක් පවත්වා ගනිමින්, ඉතා වේගයෙන් වර්ධනය වන වැඩකරන ජනගහනය ශ්‍රම බලකායට එකතු කර ගැනීමට හා ශ්‍රම බලකායට වඩා වැඩි කාන්තා සහභාගිත්වයක් ලබා ගැනීමට සුදුසු උපායමාර්ගයන් ක්‍රියාවට නංවා ඇති අතර, ඉතුරුම් සහ ආයෝජන දිරිගැන්වීමට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම තුළින් වඩාත් හිතවාදී ආර්ථික ප්‍රතිඵල සහ ඉහළ ඒක පුද්ගල ආදායම් මට්ටම් ළඟාකර ගැනීමට සමත්ව ඇත.

ප්‍රජා විද්‍යා සංක්‍රාන්තියේ දෙවන අදියර, දැනට වැඩකරන වයස් සීමාවේ පසුවන ජනගහනය, වයස්ගත ජනගහනයට මාරු වීමේ දී සිදුවන අතර, එමගින් ප්‍රජා විද්‍යා සංක්‍රාන්තියේ දෙවන ප්‍රතිලාභය අත්පත් කර ගැනීමට අවස්ථාව සැලසේ. ආර්ථික විශේෂඥයන් සඳහන් කරන පරිදි, ඉතා පුළුල්ව පැතුරුණු සමාජ සුරක්ෂිතතාවයක් හා පවුලෙන් ලැබෙන පිහිටාධාර නැති පරිසරයක් තුළ, වඩා දිගු ආයු කාලයක බලාපොරොත්තු හා වඩා දික් වූ විශ්‍රාමික කාලපරිච්ඡේදයන්, ඉතිරි කිරීම් වඩාත් දිරිගැන්වීම සඳහා ප්‍රබල අනුබලයක් ලබාදේ. එමනිසා ජනගහනයේ වියපත් වීම තුළින් ජනගහනයේ වඩා විශාල වත්කම් ප්‍රමාණයකට හිමිකම් ඇති වයස්ගත පුද්ගල කාණ්ඩය ඉහළ යන අතර, එමගින් ඉහළ වූ සම්පත් රැස් කිරීමක් හා වත්කම්වල ආදායම් ලැබීමක් සිදුවේ. මෙමගින්, එක් සේවකයෙකු වෙනුවෙන් ඇති ප්‍රාග්ධන ප්‍රමාණයේ වැඩිවීමක් ජනනය වන අතර, එමගින් ශ්‍රම ඵලදායිතාවය වැඩිදියුණු වී වඩා වැඩි නිෂ්පාදන ප්‍රමාණයක් ඇති කරයි.

2011 ජන සංගණනයේ දී නිරීක්ෂණය කළ පරිදි, ජනගහනයේ වයස්ගත පුද්ගලයන් වැඩි වීමේ නැඹුරුතාව, අනාගතයේ දී ආර්ථිකයට බරක් නොවන පරිදි ආර්ථික වර්ධනයට උපකාරී වන අයුරින් යොදා ගැනීමට අවශ්‍ය විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය තීරණ පූර්වයෙන් ගැනීමට ඇති අවශ්‍යතාව වඩාත් ඉස්මතු කරයි. ප්‍රජා විද්‍යා සංක්‍රාන්තියේ දෙවන ප්‍රතිලාභය දිගුකාලීනව ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව, වයස්ගත ජනගහනය වඩා වැඩි කාලයක් ශ්‍රම බලකායේ රඳවා ගැනීමට අනුබල දෙන ආකාරයෙන්, වැඩකරන වසර ගණන වැඩි කිරීම සඳහා සුදුසු වන අයුරින් විශ්‍රාමික ප්‍රතිලාභයන් වෙනස් කිරීම, වෙනස් වන ආර්ථිකයට අනුගත වන ලෙස මානව සම්පතෙහි කුසලතාවයන් අඛණ්ඩව වර්ධනය කර ගැනීමට කටයුතු යෙදීම, වයස් අනුව සිදුවන වෙනස්ව සැලකීම් අවම කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන හා සංස්කෘතික වෙනස්කම් සැලසීම ආදී සුදුසු ප්‍රතිපත්තීන් යොදා ගතයුතු වේ. එසේම, ප්‍රජා විද්‍යා සංක්‍රාන්තියේ දෙවන ප්‍රතිලාභය ජනතාවගේ හා ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන්නන්ගේ අනාගතය දැක්මෙහි හැකියාව හා අනාගතයේ දී සිදුවන්නා වූ ප්‍රජා විද්‍යාත්මක වෙනස්වීම් සඳහා වඩාත් ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ හැකියාව යන කරුණු මත රඳා පවතී.

මූලාශ්‍ර:


1. Department of Census and Statistics, Sri Lanka (2013): Preliminary Reports of Population and Housing 2011.
2. David E Bloom, David Canning and Gunther Fink, Implications of Population Ageing for Economic Growth, PGDA Working Paper No. 64, January 2011.
3. Andrew Mason: Demographic Transition and Demographic Dividends in Developed and Developing Countries.
4. K. Navaneetham, A. Dharmalingam, A Review of Age Structural Transition and Demographic Dividend in South Asia: Opportunities and Challenges. Journal of Population Ageing, Vol. 5, No. 4 (2012)
5. W.Indralal De Silva, The Age Structure Transition and the Demographic Dividend: An Opportuniy for Rapid Economic Take-off in Sri Lanka. Sri Lanka Journal of Advanced Social Studies, Vol. 2, No.1 (2012).


### ශ්‍රම බලකාය

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සමස්ත දිවයිනම ආවරණය කරමින් සිදු කළ කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, 2012 වසරේ දී ශ්‍රම බලකාය මිලියන 8.465 දක්වා සියයට 1.1 කින් පහළ වැටිණි.** වයස අවුරුදු 10 සහ ඊට වැඩි ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය, ශ්‍රම බලකාය ලෙස අර්ථ දැක්වේ. ඒ අනුව, සේවා නියුක්ති සහ සේවා වියුක්ති යන දෙයංශයෙහිම පුද්ගල සංඛ්‍යාව පහළ වැටිණි. ආර්ථිකමය වශයෙන් ක්‍රියාකාරී පුද්ගලයන් පිටතට සංක්‍රමණය වීම ඉහළ යාම සහ ආර්ථිකමය වශයෙන් ක්‍රියාකාරී නොවන ජනගහනය ඉහළ යාම මෙම අඩුවීම කෙරෙහි ආයක වන්නට ඇත.

**ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සුළු වශයෙන් පහළ වැටිණි.** ශ්‍රම බලකාය, වයස අවුරුදු 10 හා ඊට වැඩි කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දක්වනු ලබන ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය, පෙර වසරේ පැවති සියයට 47.8 හි සිට 2012 වසරේ දී සියයට 47.2

**4.8 සංඛ්‍යා සටහන** **කුටුම්භ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය (අ)**

| ශීර්ෂය | 2011 | 2012 (ආ)(ඇ) දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
|---|---|---|---|---|---|
| කුටුම්භ ජනගහනය (ඈ) | | | | | |
| පුද්ගලයන් '000 | **17,910** | **17,785** | **17,838** | **18,123** | **17,915** |
| ශ්‍රම බලකාය | | | | | |
| පුද්ගලයන් '000 | **8,555** | **8,260** | **8,418** | **8,716** | **8,465** |
| සේවා නියුක්ත | 8,197 | 7,936 | 8,075 | 8,375 | 8,129 |
| සේවා වියුක්ත | 358 | 324 | 343 | 341 | 336 |
| ශ්‍රම බලකා සහභාගිත්ව | | | | | |
| අනුපාතිකය (ඉ)% | **47.8** | **48.4** | **47.2** | **48.1** | **47.2** |
| පුරුෂ | 66.2 | 66.5 | 66.2 | 67.6 | 66.8 |
| ස්ත්‍රී | 31.2 | 28.6 | 30.3 | 30.7 | 29.9 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දත්ත ඇතුළත් වේ
(ආ) තාවකාලික
(ඇ) 2012 පළමු කාර්තුව සඳහා කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වා නොමැත
(ඈ) වයස අවු. 10 සහ ඊට වැඩි කුටුම්භ ජනගහනය
(ඉ) ශ්‍රම බලකාය, වයස අවුරුදු 10 හා ඊට වැඩි කුටුම්භ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස

දක්වා පහළ ගියේය. 2011 වසරේ දී සියයට 31.2 ක්ව පැවති කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2012 වසරේ ඇස්තමේන්තු කිරීමට අනුව සියයට 29.9 දක්වා අඩුවීම මෙම පහළ යාම සඳහා හේතු විය. පසුගිය වසර කිහිපය තුළ කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය මෙන් දෙගුණයකටත් වඩා ඉහළ අගයක් අඛණ්ඩව පවත්වාගත් පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2011 වසරේ පැවති සියයට 66.2 හි සිට 2012 වසරේ දී සියයට 66.8 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. ග්‍රාමීය අංශයේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2011 වසරේ පැවති 48.4 හි සිට 2012 වසරේ දී සියයට 48 ක් දක්වා සුළු වශයෙන් පහළ ගිය අතර, නාගරික අංශයේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2011 වසරේ පැවති සියයට 43.4 හි සිට 2012 වසරෙහි දී සියයට 43.7 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. ග්‍රාමීය අංශයේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය පහළ යාම කෙරෙහි කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය 2011 වසරේ පැවති සියයට 32 හි සිට 2012 වසරේ දී සියයට 30.6 දක්වා අඩුවීම මුළුමනින්ම හේතු විය. ග්‍රාමීය අංශයේ පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්වය 2012 වසරේ දී සියයට 67.5 දක්වා මඳ වශයෙන් ඉහළ ගියේය. නාගරික අංශයෙහි පුරුෂ සහ කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයන් දෙකම පිළිවෙළින් 2011 වසරෙහි පැවති සියයට 63 සහ සියයට 25.6 හි සිට 2012 වසරේ දී පිළිවෙළින් සියයට 63.4 සහ සියයට 26.4 දක්වා ඉහළ ගියේය.

## සේවා නියුක්තිය

**කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට** අනුව 2012 වසරේ දී සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව මිලියන 8.129 දක්වා සියයට 0.8 කින් පහත වැටිණි.[1] සේවා නියුක්ති පුද්ගලයන්ගේ සංයුතිය ආර්ථිකයේ ප්‍රධාන අංශ අතර බෙදී ඇති ආකාරය 2012 වසරේ දී වෙනස් වී ඇත. කර්මාන්ත සහ සේවා අංශයන්හි කොටස් පිළිවෙළින් පෙර වසරේ පැවති සියයට 24.1 සහ සියයට 42.8 හි සිට 2012 වසරේ දී පිළිවෙළින් සියයට 26.1 සහ සියයට 42.9 දක්වා ඉහළ ගිය අතර, කෘෂිකර්මාන්ත අංශයේ කොටස 2011 වසරේ පැවති සියයට 33 හි සිට 2012 වසරේ දී සියයට 31 දක්වා පහළ යාමක් වාර්තා කළේය. ඉදිකිරීම්, පතල් හා කැණීම්, විදුලිය, ගෑස් හා ජල සම්පාදන ක්ෂේත්‍රයන්හි ආරම්භ කරන ලද ව්‍යාපෘති හරහා නව රැකියා අවස්ථාවන් බිහිවීම මුළු සේවා නියුක්තිය කෙරෙහි කර්මාන්ත අංශයේ දායකත්වය ඉහළ නැංවීමට උපකාරී විය. නිමැවුම් අංශයේ සේවා නියුක්තිය ද ඉහළ ගියේය. සේවා අංශයේ කොටස ඉහළ ගිය ද, මෙම අංශයේ මුළු සේවා නියුක්ති පුද්ගල සංඛ්‍යාව පහළ වැටිණි. විවිධ උප අංශයෙහි සේවා නියුක්ති සංඛ්‍යාව අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. වෙළෙඳ හා හෝටල්; ප්‍රවාහන, ගබඩා සහ සන්නිවේදන උප අංශයන් සේවා අංශයෙහි රැකියා අවස්ථාවන් උත්පාදනය සඳහා ධනාත්මකව දායක විය.

**සේවා නියුක්තිය එහි ස්වභාවය අනුව වර්ග කළ විට රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි සහ ස්වයං රැකියාවල නියුතු ජනගහනයේ සංඛ්‍යාව මෙන්ම කොටස ද ඉහළ ගියේය.** මුළු රැකියා නියුක්තියෙහි තම කොටස සියයට 41.3 දක්වා ඉහළ නංවමින් පෞද්ගලික අංශයෙහි සේවා නියුක්තිකයන් සංඛ්‍යාව මිලියන 3.356 දක්වා සියයට 1 කින් වැඩි විය. රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය මිලියන 1.230 දක්වා සියයට 4.3 කින් වැඩි වූ අතර, මුළු සේවා නියුක්තියෙන් එහි කොටස සියයට 15.1 දක්වා 2012 වසරේ දී ඉහළ ගියේය. ස්වයං රැකියා කටයුතුවල නියුක්තවූවන්ගේ සංඛ්‍යාව

[1] ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව නිර්වචනය කර ඇති පරිදි සමීක්ෂණය සිදු කළ කාලච්ඡේදය තුළ වැටුපක්, ලාභයක් හෝ පවුලට යම් ප්‍රතිලාභයක් (ගෙවීමක් නොලබන) ලබා ගැනීම සඳහා යම් කාර්යයක නියුක්තව සිටි පුද්ගලයෙක් සේවා නියුක්තිකයෙකු ලෙස සැලකේ. සේවා තත්ත්වය අනුව සලකා බැලීමේ දී කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය පවත්වන ලද කාලච්ඡේදය තුළ, යම් ගෙවීමක් ලබන සේවකයන්, සේවා යෝජකයන්, ස්වයං රැකියාවල නියුතු අය හෝ ගෙවීමක් නොලබන පවුලේ සේවකයන්, සේවා නියුක්තිකයන් ලෙස ගණන් ගැනේ. සමීක්ෂණය පැවති කාලයේ දී වැඩක නොයෙදුන ද රැකියාවක් ඇති පුද්ගලයන් සේවා නියුක්තිකයන් ලෙස පිළිගැනේ. අසනීප වීම, අයහපත් කාලගුණ තත්ත්වය හෝ කාර්මික ආරවුල් හේතුකොටගෙන තාවකාලිකව සේවයට වාර්තා නොකළ ද, එම පුද්ගලයන් ද සේවා නියුක්තිකයන් ලෙස සැලකේ.

**4.9 සංඛ්‍යා සටහන**

## ආර්ථික ක්‍රියාකාරිත්වය අනුව සේවා නියුක්තිය (අ)

| අංශය | පුද්ගලයන් '000 2011 | 2012 (ආ)(ඇ) දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | මුළු සේවා නියුක්තියේ ප්‍රතිශතය 2011 | 2012 (ආ)(ඇ) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකර්මාන්ත** | **2,708** | **2,378** | **2,496** | **2,684** | **2,519** | **33.0** | **31.0** |
| **කර්මාන්ත** | **1,977** | **2,128** | **2,055** | **2,175** | **2,119** | **24.1** | **26.1** |
| නිමැවුම් කර්මාන්ත | 1,387 | 1,426 | 1,393 | 1,493 | 1,437 | 16.9 | 17.7 |
| ඉදිකිරීම්, පතල් හා කැණීම්, විදුලිය, ගෑස්, සහ ජලය සැපයුම | 590 | 702 | 662 | 681 | 682 | 7.2 | 8.4 |
| **සේවා** | **3,512** | **3,431** | **3,524** | **3,516** | **3,490** | **42.8** | **42.9** |
| වෙළෙඳාම සහ හෝටල් ආදිය | 1,232 | 1,267 | 1,274 | 1,267 | 1,269 | 15.0 | 15.6 |
| ප්‍රවාහන, ගබඩා කිරීම සහ සන්නිවේදනය | 505 | 515 | 549 | 513 | 526 | 6.2 | 6.5 |
| මූල්‍ය, රක්ෂණ සහ නිශ්චල දේපල | 287 | 255 | 316 | 278 | 283 | 3.5 | 3.5 |
| පෞද්ගලික සේවා, විවිධ සහ වෙනත් සේවාවන් | 1,488 | 1,394 | 1,384 | 1,458 | 1,412 | 18.1 | 17.4 |
| **මුළු සේවා නියුක්තිය** | **8,197** | **7,936** | **8,075** | **8,375** | **8,129** | **100.0** | **100.0** |
| ශ්‍රම බලකායේ ප්‍රතිශතය | 95.8 | 96.1 | 95.9 | 96.1 | 96.0 | | |

(අ) සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දත්ත ඇතුළත් වේ
(ආ) තාවකාලික
(ඇ) 2012 පළමු කාර්තුව සඳහා කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වා නොමැත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මිලියන 2.592 දක්වා ආන්තිකව ඉහළ ගිය අතර, එහි කොටස මුළු සේවා නියුක්තිකයන් සංඛ්‍යාවෙන් 31.9 දක්වා වැඩි විය. සේවා යෝජක සංඛ්‍යාව 231,087 දක්වා සියයට 1.4 කින් සහ වැටුප් නොලබන පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව 719,970 දක්වා සියයට 18.4 කින් ද පහළ වැටුණු අතර, ඔවුන්ට අදාළ කොටස් ද පිළිවෙළින් සියයට 2.8 කින් සහ සියයට 8.9 කින් පහළ ගියේය. ග්‍රාමීය අංශයේ කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන කාන්තාවන් සංඛ්‍යාව අඩුවීම, වැටුප් නොලබන පවුලේ සාමාජික සංඛ්‍යාව අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද රාජ්‍ය අංශයේ සේවා නියුක්ති සමීක්ෂණයට අනුව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය යන දෙයංශයෙහිම සේවා නියුක්ති සංඛ්‍යාව ඉහළ ගියේය. ද්විතීයික සහ ප්‍රාථමික මට්ටම්වල අනියම් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් සංඛ්‍යාව ඉහළ යාම, රාජ්‍ය අංශයෙහි ඉහළ යාම සඳහා මූලික විය. මෙම වැඩි වීමට ශ්‍රී ලංකා නාවික හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා වූ නව බඳවා ගැනීම් ප්‍රධාන වශයෙන් දායක විය. අර්ධ රාජ්‍ය අංශය තුළ සියලුම මට්ටම්වල පාහේ සේවා නියුක්තිය සුළු වශයෙන් ඉහළ ගියේය.

**4.10 සංඛ්‍යා සටහන**

## සේවා නියුක්ති මූලයන් (අ)

ප්‍රතිශතය

| වර්ෂය | රාජ්‍ය අංශයේ සේවකයින් | පෞද්ගලික අංශයේ සේවකයින් | සේව්‍යයන් | ස්වයං රැකියාවන්හි නියුතු වූවන් | ගෙවීමක් නොලද පවුලේ සේවකයින් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2011 | 14.4 | 40.5 | 2.9 | 31.5 | 10.8 | 100.0 |
| **2012 (වාර්ෂික) (ආ)(ඇ)** | **15.1** | **41.3** | **2.8** | **31.9** | **8.9** | **100.0** |
| දෙවන කාර්තුව | 14.3 | 41.9 | 2.5 | 33.1 | 8.1 | 100.0 |
| තෙවන කාර්තුව | 15.0 | 41.5 | 3.0 | 31.2 | 9.4 | 100.0 |
| සිව්වන කාර්තුව | 16.1 | 40.5 | 3.0 | 31.4 | 9.0 | 100.0 |

(අ) සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දත්ත ඇතුළත් වේ
(ආ) තාවකාලික
(ඇ) 2012 පළමු කාර්තුව සඳහා කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වා නොමැත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.11 සංඛ්‍යා සටහන** — **රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය**

| අංශය | 2010 | 2011 | 2012 (අ) | ප්‍රතිශත වෙනස 2011/ 2010 | ප්‍රතිශත වෙනස 2012/ 2011 (අ) |
|---|---|---|---|---|---|
| රාජ්‍ය (ආ) | 969,574 | 980,589 | 993,037 | 1.1 | 1.3 |
| අර්ධ රාජ්‍ය (ඇ) | 250,017 | 249,199 | 251,278 | -0.3 | 0.8 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **1,219,591** | **1,229,788** | **1,244,315** | **0.8** | **1.2** |

(අ) තාවකාලික
(ආ) මධ්‍යම රජය, පළාත් පාලන ආයතන හා පළාත් සභා
(ඇ) රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය අධිකාරීන්


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සේවා වියුක්තිය

පසුගිය වසර කිහිපය තුළ දක්නට ලැබුණු පහළ යාමේ උපනතිය තවදුරටත් අඛණ්ඩව අනුගමනය කරමින්, සේවා වියුක්ති අනුපාතය 2011 වසරේ වාර්තා වූ සියයට 4.2 හි සිට 2012 වසරේ දී සියයට 4 ක් දක්වා පහත වැටිණි. ආර්ථිකයේ අංශ තුනෙහිම ආර්ථික ක්‍රියාවන්හි සිදු වූ ප්‍රසාරණයට සමගාමීව සේවා වියුක්තිකයන් සංඛ්‍යාව 2011 වසරේ දී වාර්තා වූ මිලියන 0.358 හි සිට 2012 වසරේ දී මිලියන 0.336 ක් දක්වා අඩු විය. පුරුෂ පක්ෂයේ සේවා වියුක්තිය 2011 වසරේ දී වාර්තා වූ සියයට 2.7 හි සිට ඉතා සුළු ඉහළ යාමක් වාර්තා කළ ද, 2012 වසරේ දී සියයට 2.8 ක සැලකිය යුතු පහළ අගයක පැවතුණි. ස්ත්‍රී පක්ෂයේ සේවා වියුක්තිය 2011 වසරේ දී පැවති සියයට 7 හි සිට 2012 වසරේ දී සියයට 6.2 ක් දක්වා පහළ වැටිණි.

**උගත් පුද්ගලයන් අතර සේවා වියුක්තියෙහි අඩුවීම දිරිමත් කරවනසුළු වර්ධනයකි.** අ.පො.ස. (උසස් පෙළ) සහ ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගල කාණ්ඩය තුළ සේවා වියුක්තිය 2011 වසරේ පැවති සියයට 9 හි සිට 2012 වසරේ දී සියයට 7.5 දක්වා අඩු විය. කෙසේ වුවද, ඉහළම සේවා වියුක්ති අනුපාතිකය වාර්තා කළ මෙම කාණ්ඩයට පසුව වැඩිම සේවා වියුක්ති අනුපාතිකය වාර්තා වී ඇත්තේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සුදුසුකම් සහිත පුද්ගල කාණ්ඩය අතරය. මෙම කාණ්ඩයේ සේවා වියුක්තිය, 2011 වසරේ දී පැවති සියයට 5.2 හි සිට 2012 වසරේ දී සියයට 6 ක් දක්වා ඉහළ නැගිණි.

**4.2 රූප සටහන** — **ශ්‍රම බලකාය සහ සේවා වියුක්තියේ ප්‍රවණතාවන් (2008-2012)**




සටහන : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2011 සිව්වන සහ 2012 පළමුවන කාර්තු සඳහා කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණ පවත්වා නොමැත.

**4.12 සංඛ්‍යා සටහන** — **සේවා වියුක්ති අනුපාතය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස) (අ)**

| ශීර්ෂය | 2011 | 2012 (ආ)(ඇ) දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
|---|---|---|---|---|---|
| **සමස්ත** | 4.2 | 3.9 | 4.1 | 3.9 | 4.0 |
| **ස්ත්‍රී පුරුෂ අනුව** | | | | | |
| පුරුෂ | 2.7 | 3.0 | 2.9 | 2.7 | 2.8 |
| ස්ත්‍රී | 7.0 | 5.9 | 6.5 | 6.3 | 6.2 |
| **අධ්‍යාපන මට්ටම අනුව** | | | | | |
| 4 ශ්‍රේණිය/5 වසර සහ ඊට පහළ | - | - | - | - | - |
| 5-9 ශ්‍රේණිය/6-10 වසර | 3.3 | 3.0 | 3.2 | 3.3 | 3.2 |
| අ.පො.ස. (සා.පෙ) | 5.2 | 6.1 | 6.7 | 5.3 | 6.0 |
| අ.පො.ස. (උ.පෙ) සහ ඊට ඉහළ | 9.0 | 8.6 | 7.1 | 7.1 | 7.5 |
| **වයස් කාණ්ඩ අනුව** | | | | | |
| 15-19 | 15.5 | 18.5 | 19.1 | 19.2 | 18.9 |
| 20-29 | 12.3 | 12.3 | 11.2 | 10.5 | 11.3 |
| 30-39 | 2.7 | 2.3 | 2.9 | 2.4 | 2.5 |
| 40 සහ ඊට ඉහළ | 0.7 | 0.5 | 1.0 | 0.9 | 0.8 |

(අ) සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දත්ත ඇතුළත් වේ
(ආ) තාවකාලික
(ඇ) 2012 පළමු කාර්තුව සඳහා කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමෙන්තුව මගින් පවත්වා නොමැත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**2012 වසරේ දී සමහර වයස් කාණ්ඩයන් සඳහා සේවා වියුක්තිය පහළ ගිය ද, තරුණ සේවා වියුක්තිය ඉහළ අගයක පැවතිණි.** අවුරුදු 20-29 යන වයස් කාණ්ඩයෙහි සේවා වියුක්ති අනුපාතිකය 2011 වසරේ දී වාර්තා වූ සියයට 12.3 හි සිට 2012 දී සියයට 11.3 ක් දක්වා පහත වැටිණි. සේවා වියුක්තිය ඉතා ඉහළ වූයේ අවුරුදු 15-19 වයස් කාණ්ඩයෙහිය. එය, 2011 දී වාර්තා වූ සියයට 15.5 හි සිට 2012 දී සියයට 18.9 ක් දක්වා ඉහළ නැගිණි. වෙළෙඳපොළෙහි පවතින රැකියා අවස්ථාවන් සහ රැකියා අපේක්ෂාවන් අතර ඇති නොගැලපීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වන්නට ඇත. තාක්ෂණික, වෘත්තීමය සහ තොරතුරු තාක්ෂණය මත පදනම් වූ පුහුණු වැඩසටහන් කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කිරීම මගින් තරුණ ජනගහනය සේවයෙහි යෙදවිය හැකි බව තවදුරටත් වැඩිදියුණු වනු ඇත. 2012 දී අවුරුදු 30-39 සහ අවුරුදු 40 ට වැඩි වයස් කාණ්ඩවල සේවා වියුක්ති අනුපාතික පිළිවෙළින් සියයට 2.5 ක් සහ සියයට 0.8 ක් වශයෙන් ජාතික සාමාන්‍යයට වඩා අඩු මට්ටමක පැවතිණි.

## විදේශ සේවා නියුක්තිය

2012 වසරේ දී ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ රැකියා අවස්ථාවන් ඉහළ ගිය අතර, එය ඉතා වැදගත් සේවා නියුක්ති මූලාශ්‍රයක් මෙන්ම රට තුළට විදේශ විනිමය ගලා එන ස්ථාවර ප්‍රභවයක් ද විය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි (ශ්‍රී ලං.වි.සේ.නි.කා.) ඇස්තමේන්තුවලට අනුව 2012 වසරේ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු සංඛ්‍යාව 279,482 දක්වා සියයට 6.3 කින් වර්ධනය විය. මෙම වර්ධනය ගෘහ සේවිකා, ලිපිකරු හා අදාළ ක්ෂේත්‍ර, මධ්‍යම මට්ටම සහ වෘත්තිකයන් යන කාණ්ඩවල දක්නට ලැබිණි. විදේශ රැකියා සඳහා පිටත්වයාම් සංඛ්‍යාවෙහි විශාලතම ඉහළ යාම වූ 10,735 වාර්තා වූයේ ගෘහ සේවිකා කාණ්ඩයේය. 2011 වසරේ දී, මුළු පිටත්ව යාම්වලින් සියයට 40.9 ක් වූ ගෘහ සේවිකා කාණ්ඩය 2012 දී සියයට 42.3 දක්වා වර්ධනය විය. ලිපිකරු හා අදාළ ක්ෂේත්‍ර, මධ්‍යම මට්ටම සහ වෘත්තිකයන් යන කාණ්ඩවල රැකියා සඳහා විදේශගත වීම් සංඛ්‍යාව සහ මුළු පිටත්වයාම්වලින් එකී කාණ්ඩ සතු වූ කොටස තවදුරටත් අඩු මට්ටමක පැවතුණ ද, මෙම කාණ්ඩයන් 2012 වසරේ දී සියයට 11-62 අතර පරාසයක සැලකිය යුතු ඉහළ යාමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, පුහුණු, අර්ධ පුහුණු හා නුපුහුණු ශ්‍රමික කාණ්ඩයන්හි පිටත්ව යාම්වල පහළ යාමක් වාර්තා වූ අතර, ඉහළම අඩුවීම නුපුහුණු ශ්‍රමික කාණ්ඩය විසින් වාර්තා කරන ලදී.

පසුගිය වසර කිහිපයේ දී දක්නට ලැබුණු පරිදි 2012 වසරේ දී ද පුරුෂයන්ගේ විදේශ රැකියා සඳහා පිටත්ව යාම් සංඛ්‍යාව මෙන්ම මුළු පිටත්ව යාම්වලින් ඔවුන් සතු කොටස ද ස්ත්‍රීන්ගේ එම අගයන්ට වඩා වැඩි අගයක පැවතිණි. එසේ වුවත්, 2012 වසරේ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ස්ත්‍රීන් සංඛ්‍යාව, පුරුෂ සංඛ්‍යාවට වඩා වැඩි අනුපාතයකින් වැඩි වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මුළු විදේශගත වීම්වල පුරුෂ:ස්ත්‍රී අනුපාතය 2011 වසරේ පැවති 52:48 සමග සසඳන විට 2012 වසරේ දී 51:49 ක් විය.

වසර තුළ දී බලපත්‍රලාභී විදේශ සේවා නියෝජිතයන් විසින් සම්පාදනය කරන ලද විදේශ රැකියා සඳහා පිටත්ව යාම් සැලකිය යුතු ලෙස අඩු වූ අතර, වෙනත් මූලාශ්‍ර මගින් සම්පාදනය කෙරුණු විදේශ රැකියා සඳහා පිටත්ව යාම් සැලකිය යුතු ලෙස වැඩි විය. මුළු පිටත්ව යාම්වලින් ලියාපදිංචි නියෝජිතයන් විසින් සම්පාදනය කරන ලද පිටත්ව යාම් 2011 වසරේ දී වාර්තා වූ සියයට 56.6 සිට 2012 වසරේ දී සියයට 37.3 දක්වා අඩු වූ අතර, වෙනත් මූලාශ්‍ර මගින් පිළියෙළ කෙරුණු පිටත්ව යාම් 2011 වසරේ දී වාර්තා වූ සියයට 44.4 සිට 2012 වසරේ දී සියයට 62.7 දක්වා වර්ධනය විය. අවුරුදු 30-34 වයස් කාණ්ඩය තුළ වාර්තා වූ සැලකිය යුතු අඩුවීම හැරුණු කොට, අනෙකුත් සියලුම වයස් කාණ්ඩවල, විශේෂයෙන් අවුරුදු 25-29 වයස් කාණ්ඩයේ පිටත්ව යාම් සියයට 80.4 කින් ඉහළ ගියේය.

**4.13 සංඛ්‍යා සටහන** — **විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්**

| විදේශ සේවා නියුක්තිය | 2010 | | 2011 | | 2012 (අ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| **මුළු විදේශ රැකියා සංඛ්‍යාව** | **267,507** | **100.0** | **262,961** | **100.0** | **279,482** | **100.0** |
| මූලයන් අනුව | | | | | | |
| ලියාපදිංචි නියෝජිතයන් | 160,500 | 60.0 | 146,293 | 55.6 | 104,216 | 37.3 |
| වෙනත් | 107,007 | 40.0 | 116,668 | 44.4 | 175,266 | 62.7 |
| ස්ත්‍රී/පුරුෂ අනුව | | | | | | |
| පුරුෂ | 148,001 | 55.3 | 136,307 | 51.8 | 142,331 | 50.9 |
| ස්ත්‍රී | 119,506 | 44.7 | 126,654 | 48.2 | 137,151 | 49.1 |
| ශ්‍රම කාණ්ඩය අනුව | | | | | | |
| වෘත්තීය | 3,057 | 1.1 | 3,848 | 1.5 | 4,300 | 1.5 |
| මධ්‍යම | 6,884 | 2.6 | 6,136 | 2.3 | 9,223 | 3.3 |
| ලිපිකරු හා ඒ ආශ්‍රිත | 7,923 | 3.0 | 9,907 | 3.8 | 16,016 | 5.7 |
| පුහුණු ශ්‍රමික | 71,537 | 26.7 | 67,746 | 25.8 | 66,275 | 23.7 |
| අර්ධ පුහුණු ශ්‍රමික | 4,932 | 1.8 | 4,182 | 1.6 | 3,406 | 1.2 |
| නුපුහුණු ශ්‍රමික | 60,422 | 22.6 | 63,642 | 24.1 | 62,027 | 22.3 |
| ගෘහ සේවිකා | 112,752 | 42.1 | 107,500 | 40.9 | 118,235 | 42.3 |

(අ) තාවකාලික

මූලයः ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**4.14 සංඛ්‍යා සටහන — ගමනාන්තය අනුව විදේශ සේවා සංක්‍රමණ**

| රට | 2011 | | 2012 (අ) | | වෙනස (අ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය (%) | සංඛ්‍යාව | දායකත්වය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| සෞදි අරාබියාව | 68,552 | 26.1 | 97,398 | 34.8 | 28,846 | 42.1 |
| කටාර් | 52,743 | 20.1 | 56,925 | 20.4 | 4,182 | 7.9 |
| කුවේට් | 50,624 | 19.2 | 43,804 | 15.7 | -6,820 | -13.5 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 39,320 | 15.0 | 37,542 | 13.4 | -1,778 | -4.5 |
| වෙනත් | 51,722 | 19.7 | 43,813 | 15.7 | -7,909 | -15.3 |
| **එකතුව** | **262,961** | **100.0** | **279,482** | **100.0** | **16,521** | **6.3** |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**2012 වසරේ දී ද, මැද පෙරදිග රටවල් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා රැකියා සපයන ප්‍රධාන වෙළෙඳපොළ බවට පත් විය.** මෙම රටවල් වෙත පිටත්ව යාම්, මුළු සංක්‍රමිකයන්ගෙන් සියයට 94.4 ක් වූ අතර, 2012 වසරේ දී ඔවුන් ප්‍රධාන වශයෙන්ම ගෘහ සේවිකාවන්ගෙන් සමන්විත විය. 2011 වසරේ දී මුළු සංක්‍රමික ශ්‍රමිකයන්ගෙන් සියයට 80.3 කට දායක වූ සෞදි අරාබිය, කටාර්, කුවේට් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන මැද පෙරදිග රටවල්, 2012 වසරේ දී මුළු සංක්‍රමික ශ්‍රමිකයන්ගෙන් සියයට 84.3 කට දායක විය. මෙම රටවල් අතුරින්, සෞදි අරාබිය වෙත පිටත්ව යාම් පෙර වසරට සාපේක්ෂව සියයට 42.1 කින් ඉහළ යමින් 97,398 ක් ලෙස වාර්තා කෙරිණි. කෙසේ වුවද, විදේශ රැකියා නියුක්තියෙහිලා මැද පෙරදිග රටවල් මත විශාල වශයෙන් යැපීම තවදුරටත් පිළිබිඹු කරමින් මැදපෙරදිග රටවල් හැර අනෙකුත් රටවල් වෙත පිටත්ව යාම්හි පහළ යාමක් වාර්තා විය. ඒ අනුව, මෙම රටවල් වෙත සංක්‍රමණය වූ ශ්‍රමිකයන්ගේ සාපේක්ෂ කොටස කලින් වසරෙහි වූ සියයට 19.7 සිට 2012 වසරේ දී සියයට 15.7 දක්වා පහත වැටිණි.

**ආදායම් සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා මෙන්ම, ශ්‍රමිකයන්ගේ පවුල් වෙත ඇතිවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා 2012 වසර තුළ දී ශ්‍රී ලං.වි.සේ.නි.කා. විසින් සුබසාධන කටයුතු රැසක් දියත් කරන ලදී.** "විදේශ රැකියා" රක්ෂණ වැඩපිළිවෙළ, රාජ්‍ය බැංකුවල සහයෝගය සහිතව ලබාදුන් සහන පොලී සහිත නිවාස ණය හා අනෙකුත් විශේෂ ණය පහසුකම්, සංක්‍රමික ශ්‍රමිකයන්ගේ දරුවන් සඳහා ලබාදෙන ශිෂ්‍යත්ව, සංක්‍රමික ශ්‍රමිකයන්ගේ දරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් වෙන් වූ විශේෂ ඒකකයක්, රෝගාබාධ හේතුවෙන් නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන සංක්‍රමික ශ්‍රමිකයන් වෙනුවෙන් වෛද්‍ය ප්‍රතිකාර සැපයීම යනාදිය මෙම ක්‍රියාමාර්ගවලට ඇතුළත් විය.

**විදේශීය ශ්‍රම වෙළෙඳපොළෙහි තරගකාරිත්ව වාසිය වර්ධනය කිරීමේ අරමුණ සහිතව, ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ අයිතීන් තහවුරු කරන අතරම, පුහුණු ශ්‍රමික සංක්‍රමණය ප්‍රවර්ධනය කිරීම සඳහා බලධාරීන් විසින් නොකඩවා කටයුතු කළේය.** මූලාශ්‍ර රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ඉහළ නැංවීම පිණිස, ඉහළ මට්ටමේ තාක්ෂණික දැනුමැති හා පුහුණු සේවකයන් සැපයීමේ අරමුණෙන් පුහුණු වැඩසටහන් සකස් කරන ලදී. තවද, විදේශ රැකියා අවස්ථා සපයන රටවල් විවිධාංගීකරණය මෙන්ම ඔවුන් සමග සාකච්ඡා කිරීම වැඩිදියුණු කිරීමෙන් සාමාන්‍ය වැටුප් සහ රැකියා තත්ත්වය වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්තිමය ප්‍රවේශයන් හඳුන්වාදීම, මෙම අංශය තුළ ඇති විය හැකි අවදානම් සහගත තත්ත්වයන් අඩු කිරීමට ඉවහල් වනු ඇත.

**රට තුළට ශුද්ධ විදේශ විනිමය ගලා ඒමේ ඉහළම ශුද්ධ ඉපැයුම් මාර්ගය වූ විදේශ සේවා නියුක්තියෙන් ලද ඉපැයුම්, තවදුරටත් අඛණ්ඩව පැවතීමේ ලකුණු දක්නට ලැබේ.** සාම්ප්‍රදායික නොවන වෙළෙඳපොළවල ඇති නව වෙළෙඳපොළ අවස්ථා ගවේෂණය කිරීමේ ප්‍රයත්න, සංක්‍රමික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් සුරකින අතරතුර කර්මාන්තයේ පවතින අයහපත් ක්‍රියාවන් මුලිනුපුටා දැමීම සඳහා අදාළ නීති සංශෝධනය කිරීම සහ වෙනත් ආරක්ෂණ හා සුබසාධන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම මගින් විදේශ රැකියා අවස්ථාවන් මෙන්ම රටට ලැබෙන විදේශ සංක්‍රාම ප්‍රවර්ධනය වීම සඳහා මූලික වනු ඇත.

## ශ්‍රම ඵලදායිතාව

**ශ්‍රම ඵලදායිතාව 2012 වසරේ දී අඛණ්ඩව ඉහළ ගියේය.** එක් ශ්‍රමිකයකු සඳහා වන දළ දේශීය නිෂ්පාදිතය (2002 වසරේ ස්ථාවර මිල ගණන් මත පදනම් වූ) මගින් මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව සමස්තයක් ලෙස, 2012 වසරේ දී රුපියල් 374,900 දක්වා සියයට 7 කින්

**4.15 සංඛ්‍යා සටහන — ප්‍රධාන ආර්ථික අංශ අනුව ශ්‍රම ඵලදායිතාව**

| ශීර්ෂය | 2011 | 2012 (අ) |
|---|---|---|
| ස්ථාවර (2002) මිල අනුව | | |
| ද.දේ.නි. (රු. මිලියන) | **2,863,715** | **3,047,277** |
| කෘෂිකර්මාන්ත | 320,178 | 338,625 |
| කර්මාන්ත | 838,932 | 925,335 |
| සේවා | 1,704,605 | 1,783,318 |
| ශ්‍රම ඵලදායීතාව සේවා නියුක්ත එක් පුද්ගලයකු සඳහා රු. '000 (ආ) | **349.4** | **374.9** |
| කෘෂිකර්මාන්ත | 118.2 | 134.4 |
| කර්මාන්ත | 424.3 | 436.7 |
| සේවා | 485.4 | 511.0 |

(අ) තාවකාලික
(ආ) සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දත්ත ඇතුළත් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## විශේෂ සටහන 8

## තිරසාර සංවර්ධනයක් සඳහා අවශ්‍ය නිපුණතා සහ උසස් තත්ත්වයේ මානව ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා ආර්ථිකය ඇමෙරිකානු ඩොලර් බිලියන 100ක් කරා ගෙන යමින්, 2016 ට පෙර ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් 4000ක මට්ටම ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ සඳහා අවශ්‍ය පහසුකම් සැලැස්වීමටත් එමගින් වැදගත් ආර්ථික මධ්‍යස්ථානයක් බවට රට පරිවර්තනය කිරීමත් පිණිස රජය විසින් ආර්ථික කටයුතුවල ප්‍රධාන අංශ ලෙස කේන්ද්‍රස්ථාන පහක් හඳුනාගෙන ඇත. එනම් නාවික, ගුවන් සේවා, වාණිජ, බලශක්තිය සහ දැනුම සමඟ සංචාරක කර්මාන්තයයි.

ප්‍රචලිත මැදි ආදායම් වර්ධන උගුලට (Middle Income Growth Trap) හසුවීම වලක්වාලමින්, තිරසාර සංවර්ධනයක් කරා යන ගමනේ දී සම්පූර්ණ කළ යුතු පූර්ව අවශ්‍යතාවයන් කිහිපයක් පවතී. මේවාට අයත් වන්නේ, ආර්ථිකයේ අසමතුලිතතාවයන් අඩු කිරීම සහ සාර්ව ආර්ථික ස්ථායීතාවය පවත්වාගෙන යාම, ඉහළ ආයෝජන මට්ටමක් ළඟාකර ගැනීම, ඵලදායීතාවය වැඩි කිරීම, නිපුණතාව වර්ධනය කිරීම සහ මානව ප්‍රාග්ධනයේ ගුණාත්මක තත්ත්වය වැඩි දියුණු කිරීම යනාදියයි.

ඉහළ ආදායම් මට්ටමක් කරා ගමන් කිරීමේ දී, නිපුණතාවන් සහ මානව ප්‍රාග්ධනය වැදගත් වන්නේ කුමක් නිසාද යන්නට හේතු කිහිපයක් ආනුභවික අධ්‍යනයන් සහ ආර්ථික සාහිත්‍ය තුළින් හඳුනා ගත හැකිය.

(අ) ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු මානව ප්‍රාග්ධනය, ආර්ථිකය මන්දගාමී බවට පත්වීම (Slowdown) සහ මැදි ආදායම් උගුලට හසුවීමට ඇති ඉඩකඩ අඩුකරයි: තිරසාර සංවර්ධනයේ දී ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු මානව ප්‍රාග්ධනය, ආර්ථික වර්ධනයේ මන්දගාමී බව සහ ''මැදි ආදායම් උගුල'' වලක්වන ප්‍රධාන සාධක අතරින් එකක් බව හඳුනාගෙන තිබේ. අඩුම තරමින් ජනගහනයෙන් ද්විතීයික මට්ටමේ අධ්‍යාපනයක් (ද්විතීයික, විශ්වවිද්‍යාල සහ ඊට ඉහළ) ලබාගෙන ඇති ප්‍රතිශතය වැඩි කිරීම, අනෙකුත් තත්ත්වයන් සමාන වන්නේ යැයි උපකල්පනය කළහොත්, ආර්ථික වර්ධනයේ වේගය අඩුවීමට ඇති සම්භාවිතාව අඩු කරන බව සොයාගෙන ඇත (Eichengreen, Park and Shin, 2013)[1]. නමුත් සාමාන්‍ය පොදු අධ්‍යාපනයට එවැනි බලපෑමක් ඇති කිරීමට හැකි බව සොයාගෙන නැත. මෙම අධ්‍යනයට අනුව, ආර්ථික මන්දගාමීබව මග හැරීම සඳහා ''අඩු තත්ත්වයේ'' මානව ප්‍රාග්ධනයට වඩා ද්විතීයික හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ මානව ප්‍රාග්ධනය වඩා වැදගත් බව පෙනී යයි. වටිනාකම් දාමයේ පහළ අගය එකතු කළ කර්මාන්තයන්ගේ සිට ඉහළ වටිනාකම් එකතු කරන කර්මාන්ත කරා ගමන් කිරීමට, අවශ්‍ය වන්නේ නිපුණතා සහිත සේවකයන් කියා අපට සිතාගත හැකිය. ඉහළ තත්ත්වයෙන් යුතු මානව ප්‍රාග්ධනය, ව්‍යාපාර සේවා වැනි නවීන ඉහළ අගය එකතු කිරීමේ කටයුතු සඳහා විශේෂයෙන් වැදගත් වේ. තවද, මැදි ආදායම් තත්ත්වයේ සිට ඉහළ ආදායම් තත්ත්වයක් දක්වා කොරියාවේ සාර්ථක සංක්‍රාන්තිය, එහි ද්විතීක අධ්‍යාපනයේ වේගවත් ප්‍රසාරණය තුළින් පැහැදිලි වන අතර, මැලේසියාව හා තායිලන්තය මැදි ආදායම් උගුලට හසුවී ඇති ආර්ථික බවට පත්වීම එම රටවල උසස් මානව ප්‍රාග්ධනයේ හිඟය තුළින් පැහැදිලි වන බව මෙම අධ්‍යනය මගින් තවදුරටත් පෙන්වා දේ.

(ආ) ඉහළ නිපුණතාවන් නවීන සේවා අංශයේ ප්‍රසාරණයට පහසුකම් සපයයි: ලෝක මට්ටමින් ගතහොත් අධ්‍යාපනය හා සේවා සංවර්ධනය අතර ධන සම්බන්ධතාවයක් පවතී (ADB, 2012)[2]. වඩා උගත් ජනගහනයක් සහිත ආසියානු රටවල්වල විශාල සේවා අංශයක් ඇතිවීමට නැඹුරුතාවක් තිබෙන අතර, රටක ජනතාවගේ අධ්‍යාපන මට්ටම ඉහළ යන විට, රටේ සේවා අංශය ද ඒ සමඟම ප්‍රසාරණය වීමේ නැඹුරුතාවක් තිබෙන බව මෙම වාර්තාව කියා සිටියි. ව්‍යාපාර සේවා සංවර්ධනයට මානව ප්‍රාග්ධනය තීරණාත්මක වන බව සහ ව්‍යාපාර සේවාවලදී ඇමෙරිකාවේ හා අනෙකුත් දියුණු ආර්ථිකවල සාපේක්ෂ වාසිය විස්තර කිරීමට එම රටවල තිබෙන නිපුණතා සහිත සේවක බහුලත්වය සහාය වන බව මෙම වාර්තාව විස්තර කරයි. එසේම, සංවර්ධනය වන ආසියාවේ අඩු අධ්‍යාපන මට්ටම, කලාපයේ සාපේක්ෂ අවාසිය පැහැදිලි කිරීමට උපකාරී වේ. සාම්ප්‍රදායික සේවාවන්ගේ සිට නවීන සේවාවන් දක්වා වූ ආසියාවේ ගමන් වේගය අඩු කිරීමට ආසියානු රටවල පවතින නිපුණතාවන්ගේ හිඟකම බලපාන බව වාර්තාව පෙන්වා දෙයි.

(ඇ) නිපුණතාවන්, ආර්ථික කටයුතුවල කාර්යක්ෂමතාව වැඩි කරයි: නිපුණතාවන්ගේ හිඟය විවිධාකාරයෙන් ආර්ථික ක්‍රියාකාරකම්වලට බලපෑම් කරයි. ඒවා

[1] Barry Eichengreen, Donghyun Park, and Kwanho Shin. 2013, Growth Slowdowns Redux: New Evidence on the Middle-Income Trap, Working Paper No. 18673, National Bureau of Economic Research.

[2] ආසියානු සංවර්ධන බැංකුව. Asian Development Outlook 2012 Update: Services and Asia's Future Growth.

නම්, ඵලදායිතාව නැතිවීම සහ අකර්මණ්‍ය ප්‍රාග්ධනය, වැඩිවෙන වේතන පිරිවැය, ඉහළ ඉල්ලුමක් ඇති සේවකයන්ගේ ඉහළ සේවක පිරිවැටුම සහ නව සේවකයන් බඳවා ගැනීමේ සහ පුහුණු කිරීමේ වියදම වැඩිවීම යනාදියයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපාරවල කාර්යක්ෂමතාව අඩුවන අතර මෙම තත්ත්වය ව්‍යාප්ත වුවහොත් මුළු කර්මාන්ත ක්ෂේත්‍රය මෙන්ම සමස්ත ආර්ථිකයම වුවත් පීඩනයට ලක්විය හැකිය.

තාක්ෂණික මෙන්ම සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල අධ්‍යාපනයක අවශ්‍යතාවය හඳුනාගත් අයර්ලන්තය, රටේ පුහුණු සේවකයන්ගේ සංචිතය ගොඩ නැගීමට සහාය වීමට කලාපීය තාක්ෂණික පාසල් සහ ජාතික උසස් අධ්‍යාපන ආයතන දෙකක් පිහිටුවන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවල තෘතීයික සිසුන්ගේ කොටස 1965 දී වූ සියයට 75 සිට 1990 දශකයේ අගභාගයේ දී සියයට 54 දක්වා පහත වැටුණි. එම කාලය තුළ දී වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනයේ සිටි තෘතීයික සිසුන්ගේ ප්‍රමාණය සියයට 2 සිට සියයට 37 දක්වා වැඩිවිය.[3]

නිපුණතා සහ උසස් තත්ත්වයේ මානව ප්‍රාග්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලකිය හැකි පූර්ව අවශ්‍යතාවන් මොනවාද?

(අ) අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්හි දී මාර්ගෝපදේශන මූලධර්මය විය යුත්තේ ඉහළ තරගකාරීත්වයෙන් යුතු අධ්‍යාපන වෙළෙඳපොළක් කරා යෑම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමයි.

(ආ) ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය වෙනුවෙන් ආයෝජනය කිරීම වැදගත් වුවද, ආසියාවේ අවශ්‍යතාව වනුයේ, ආසියානු විශ්වවිද්‍යාලවලින් නූතන සේවා කර්මාන්තයට ගැලපෙන පරිදි සුදුසුකම්වලින් පරිපූර්ණ වූ ප්‍රමාණවත් උපාධිධාරීන් පිරිසක් බිහිකිරීමයි.[4]

(ඇ) නිපුණතා සැපයීමේදී සීමා ඇතිකරන සම්මතයන් ඉවත් කිරීම. වෘත්තිකයන්ගේ සංගම්වලින් එම වෘත්තීන් තුළට නවකයන් ඇතුළුවීම සීමාකරනු ලබන වැටකඩොළු පැනවීම නිසා මෙම තත්ත්වය ඇතිවේ.

(ඈ) ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රවීණත්වයක් ලබා තිබීම, ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය (BPO) ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතාවයකි.

(ඉ) ඉතා ඉහළ ජාත්‍යන්තර මට්ටමේ තෘතීයික අධ්‍යාපන පද්ධතියක් ගොඩනැංවීම, නූතන සේවා කර්මාන්තයන්හි මානව ප්‍රාග්ධන පරතරය පියවීම සඳහා අවශ්‍ය මූලික කරුණකි. නිපුණත්ව පුහුණුව ලාභදායී කර්මාන්තයක් වන හෙයින් පෞද්ගලික අංශයට ඒ පිළිබඳව වැඩි උනන්දුවක් තිබිය යුතු වේ. රාජ්‍ය අංශයේ සම්පත් අනෙකුත් අවශ්‍යතාවන් (උදාහරණ වශයෙන් අඩු පහසුකම් සහිත සිසුන්ට මූල්‍ය පහසුකම් ලබාදීම) සඳහා යෙදවිය හැකි වන පරිදි ප්‍රසාරණය වන තෘතීයික අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීමට පෞද්ගලික අංශයට වැඩි ඉඩක් ලබාදිය යුතු වේ.

(ඊ) දේශීය තෘතීයික අධ්‍යාපන වෙළෙඳපොළ සුප්‍රසිද්ධ විදේශ විශ්වවිද්‍යාලවලට විවෘත කිරීම තුළින්, එම තෘතීයික අධ්‍යාපන සේවා දේශීය වශයෙන් ලබා ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා ප්‍රවර්ධනය වීමට ඉඩ ඇත.

(උ) රාජ්‍ය අධ්‍යාපන ආයතන අතර තරගකාරීත්වය ඉහළ නැංවීමද වැදගත් වේ. උදාහරණයක් ලෙස, කොරියානු රජය විසින් කාර්යඵලයන් ඉහළ නැංවීම පිණිස අඩු කාර්යඵලයන් සහිත විශ්වවිද්‍යාලවලට ලබාදෙන රාජ්‍ය අරමුදල් කපාහැරීම දැක්විය හැකිය.

(ඌ) අධ්‍යාපන ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වීම පෙළඹවීමටත්, එයින් තරගකාරීත්වය ඇතිකිරීමටත් යොදාගත හැකි තවත් යාන්ත්‍රණයක් වන්නේ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයයි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් අනිවාර්යයෙන්ම පිරිවැය අධික දිගුකාලීන ක්‍රියාවලියක් වන නිසාත් එසේ කිරීමට තිබෙන හදිසි අවශ්‍යතාව නිසාත් ඒ සඳහා පියවර ගැනීම දැන්ම සිදු කළ යුතු වේ.

(එ) යෝග්‍ය දිරිගැන්වීම් මගින් "බුද්ධි ගලනය" පාලනය කිරීමට හෝ එය ආපසු හැරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(ඒ) විශ්‍රාම ගැනීමේ කාලය දීර්ඝ කිරීම, විශ්‍රාම යාමෙන් පසු ජ්‍යෙෂ්ඨ වෘත්තිකයන්ව තවදුරටත් ශ්‍රම බලකාය තුළ රැඳී සිටීමට පෙළඹවීම සහ ආයතනවලට ඔවුන්ගේ සේවකයන් සඳහා පුහුණුවීම් සහ නැවත පුහුණුවීම් ලබාදීම සඳහා අයවැය දිරිගැන්වීම් ලබාදීම.

නිපුණතා සහ මානව ප්‍රාග්ධනය ඉහළ නැංවීමට ශ්‍රී ලංකාව මෑතදී ගෙන ඇති ක්‍රියාමාර්ග ඉහත දක්වන ලද පූර්ව අවශ්‍යතාවන් සැලකිල්ලට ගෙන ඇති බව පෙන්නුම් කරයි.

(අ) විශ්වවිද්‍යාල, තාක්ෂණික විද්‍යාල සහ තෘතීයික හා ද්විතීයික අධ්‍යාපන ව්‍යුහයේ පැහැදිලි වෙනස්කම් ඇතිකිරීමේ අරමුණින් "දැනුම" ආර්ථිකයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් ලෙස හඳුනා ගැනීම.[5]

(ආ) උසස් අධ්‍යාපන පද්ධතියේ ධාරිතාව ඉහළ නැංවීමත්, ගුණාත්මක උසස් අධ්‍යාපන සේවාවක් සැපයීමත් අරමුණු කර ගනිමින් ලෝක බැංකු ආධාර යටතේ "විසිඑක් වැනි සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය" (2011-2016) ක්‍රියාත්මක කිරීම.

[3] ආසියානු සංවර්ධන බැංකුව. Asian Development Outlook 2008, පි. 70.
[4] ආසියානු සංවර්ධන බැංකුව. 2012, ඉහත දක්වන ලද වාර්තාව, පි. 72.

[5] මහින්ද චින්තන ඉදිරි දැක්ම, පි. 18.

(ඇ) දේශීය විශ්වවිද්‍යාල ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වල ඉහළ තලයකට ගෙන ඒමට ප්‍රයත්න දරන අතර විශ්වවිද්‍යාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ජාත්‍යන්තර මට්ටමේ විදේශ විශ්වවිද්‍යාල ස්ථාපනය කිරීම, දැනුම් පුරවරයන් සහ විශ්වවිද්‍යාල පුරවරයන් පිහිටුවීම සැලසුම් කර ඇති ක්‍රියාකාරකම්වලින් කිහිපයකි.

(ඈ) ජීවන නිපුණත්වයක් ලෙස ඉංග්‍රීසි භාෂාව ප්‍රවර්ධනය කිරීම. මෙම තුන්-අදියර ව්‍යාපෘතිය මගින් මුලින් ඉංග්‍රීසි ගුරුවරුන් පුහුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලද අතර තොරතුරු තාක්ෂණයේ ආධාරයෙන් දුරස්ථ ඉංග්‍රීසි භාෂා ඉගෙනීම එහි තුන්වන අදියරෙන් බලාපොරොත්තු වේ.

(ඉ) ග්‍රාමීය හා අර්ධ නාගරික ජනයා වෙත තොරතුරු තාක්ෂණය ව්‍යාප්ත කරවීම සඳහා නැණසල (දැනුම් මධ්‍යස්ථාන) පිහිටුවීම. මේ වන විට නැණසල ආයතන 679 ක් පිහිටුවා ඇත.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ වර්තමානයේ ක්‍රියාත්මක වන යෝජනාක්‍රමවලට ඌනපූරකයක් ලෙස ඉහතින් දක්වන ලද පූර්ව අවශ්‍යතා වලින් සමහරක් ද ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ යුතුය. උදාහරණයක් ලෙස, ඉහළ මට්ටමේ කීර්තියක් සහිත උසස් තාක්ෂණික විද්‍යාල අරම්භ කිරීම තුළින්, ඉදිකිරීම් සහ එයට අදාළ වෙනත් ක්ෂේත්‍රයන්හි නිපුණතා සැපයුම ඉහළ නැංවීමට හැකිවන අතර එයින් එවැනි නිපුණතා සඳහා වන පිරිවැය අඩුකරගත හැකි වේ. රටේ පෞද්ගලික අංශයේ අධ්‍යාපන ආයතන සඳහා ශක්තිමත් නියාමන සහ සහතික කිරීමේ රාමුවක් වර්ධනය කිරීම මේ සඳහා ගත හැකි තවත් පියවරකි.

පමණ ඉහළ ගියේය. කෘෂිකර්මාන්ත අංශයෙහි ශ්‍රම ඵලදායිතාව ඉහළ යාම, ඵලදායිතාව ඉහළ යාම සඳහා ප්‍රධාන දායකත්වය සැපයීය. කෘෂිකර්මාන්ත, සේවා සහ කර්මාන්ත අංශයන් 2012 වසරේ දී පිළිවෙළින් සියයට 13.7 ක, සියයට 5.3 ක සහ සියයට 2.9 ක ඉහළ යාම් වාර්තා කළේය. ශ්‍රම ඵලදායිතාව පසුගිය වසර කිහිපය පුරා සියයට 6 ක පමණ සාමාන්‍ය වැඩිවීමක් වාර්තා කරමින් ස්ථාවරව ඉහළ ගියේය.

**තිරසාර ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීම වෙනුවෙන්, තරගකාරිත්වය පවත්වා ගැනීම, නව වෙළෙඳපොළවලට පිවිසීම සහ තවදුරටත් ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ආර්ථිකයේ සියලු අංශවල ඵලදායිතාව වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.** ආයෝජන සඳහා වඩාත් සුදුසු ස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාව හඳුනාගනු ලැබීම සඳහා, වත්මන් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් ශ්‍රම ඵලදායිතා වර්ධනය මගින් ප්‍රමාණවත් ලෙස ඌනපූරණය කිරීම අවශ්‍ය වේ. නව සොයා ගැනීම් හා නව නිපැයුම් මගින් නව දැනුම උත්පාදනයේ දී, පර්යේෂණ හා සංවර්ධන කටයුතු ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තවද, නිෂ්පාදන ක්‍රියාවලීන් නවීකරණය සහ පවත්නා කර්මාන්තශාලා නැවත සකස් කිරීම, ධාරිතා උපයෝජනය වර්ධනයට මෙන්ම ශ්‍රම කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ඉවහල් වන අතරම, මෙමගින් කර්මාන්ත අංශයේ ඵලදායිතාව ද ඉහළ නැගෙනු ඇත. වඩා සතුටුදායක සේවා තත්ත්වයන් ඇති කිරීම, සේවක හැකියා වර්ධනය, විධිමත් සේවක අභිප්‍රේරණ යාන්ත්‍රණ ඇති කිරීම සහ සේවක කාර්යසාධනය හා බැඳුණු වැටුප් ක්‍රමවේද හඳුන්වා දීම ආදිය ශ්‍රම ඵලදායිතාව නංවාලීමට හේතු වනු ඇත.

**විශේෂයෙන්ම, තොරතුරු තාක්ෂණයෙන් අනුබල ලද සේවාවන් ඇතුළු නවීන තාක්ෂණ භාවිතය, සේවා අංශයෙහි ඵලදායිතාව ඉහළ නැංවීමට හේතු වනු ඇත.** සන්නිවේදන, වාණිජ, වෘත්තීය, අධ්‍යාපනික, වෛද්‍ය, නාවික සහ ගුවන් යන ක්ෂේත්‍රයන්හි නව තාක්ෂණය හා බද්ධ වූ වැඩසටහන් ක්‍රියාවට නැංවීම ඵලදායිතාව නැංවීමෙහිලා ඉවහල් වේ. ආර්ථික මෙන්ම සමාජයීය යටිතල පහසුකම් ප්‍රවර්ධනය ද මෙම අංශයේ ඵලදායිතාව කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇත. තවද, සංචාරක කර්මාන්තය ආශ්‍රිත සහ පාරිසරික වශයෙන් තිරසාර ක්‍රියාකාරකම්වල මානව සම්පත් සංවර්ධනය සේවා අංශයේ ඵලදායිතාව වැඩිදියුණු කරනු ඇත.

**කෘෂිකර්මාන්ත අංශයේ දැනට සිදුවන යාන්ත්‍රීකරණය තවදුරටත් සිදුවීම එම අංශයේ ඵලදායිතාව අඛණ්ඩව ඉහළ යාමට හේතු වනු ඇත.** වැඩිදියුණු කළ බීජ භාවිතය, නිසි පරිදි පොහොර යෙදීම හා වාරිමාර්ග පද්ධතීන්හි ප්‍රතිසංස්කරණ, ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා තවදුරටත් දායක වනු ඇත. කෘෂිකර්මාන්තයෙහි මුල් බැසගත් ව්‍යුහාත්මක දුර්වලතා බෙහෙවින්ම හේතු කොටගෙන එම අංශයෙහි පවතින අඩු ගතිකත්වය, කෘෂිකර්මාන්ත අංශයෙහි අඩු ඵලදායිතා මට්ටම මගින් පිළිබිඹු වේ. සමස්ත ශ්‍රම බලකායෙන් සියයට 30 කට ආසන්න ප්‍රමාණයක් තවමත් මෙම අංශයෙහි රැකියාවල නිරත වන බැවින්, මෙම තත්ත්වය ඇඩි සැලකිල්ලට බඳුන් විය යුතු කරුණකි. එමනිසා, වෙළෙඳපොළ මත පදනම් වූ ස්ථිරසාර උපායමාර්ගයක් මගින් දුර්වලතා පිටුදැකීම සඳහා වූ ඵලදායී පියවර ගත යුතුය. එය කෘෂි නිෂ්පාදනය මෙන්ම සාධක ඵලදායිතාව ද ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වේ.

## කම්කරු සබඳතා

**පෞද්ගලික අංශයෙහි වැඩවර්ජන සංඛ්‍යාව ඉහළ ගිය ද වැඩවර්ජන සඳහා සහභාගි වූ සේවක සංඛ්‍යාව සහ අහිමි වූ මුළු මිනිස් දින ගණන 2012 වසරේ දී සැලකිය යුතු ලෙස අඩු විය.** වතු අංශය හැරුණු විට, අනෙකුත් අංශවල වැඩවර්ජන ඉහළ යාම මුළුමනින්ම හේතු කොට ගෙන පෞද්ගලික අංශයේ කර්මාන්තවල මුළු වැඩවර්ජන සංඛ්‍යාව 2011 වසරේ දී වාර්තා වූ 27

**4.16 සංඛ්‍යා සටහන** **පෞද්ගලික අංශයේ කර්මාන්තවල වැඩ වර්ජන**

| වර්ෂය | වතු අංශය | | | වෙනත් අංශ (අ) | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන |
| 2009 | 2 | 300 | 300 | 6 | 4,720 | 7,365 | 8 | 5,020 | 7,665 |
| 2010 | 9 | 3,185 | 23,037 | 6 | 1,923 | 2,034 | 15 | 5,108 | 25,071 |
| **2011** | **19** | **6,692** | **23,513** | **8** | **3,807** | **15,673** | **27** | **11,039** | **39,186** |
| පළමු කාර්තුව | 1 | 106 | 106 | 1 | 1,500 | 5,356 | 2 | 1,606 | 5,462 |
| දෙවන කාර්තුව | 4 | 433 | 3,028 | 3 | 1,272 | 7,697 | 7 | 1,705 | 10,725 |
| තෙවන කාර්තුව | 6 | 1,062 | 2,102 | 3 | 970 | 2,490 | 9 | 2,572 | 4,592 |
| සිව්වන කාර්තුව | 8 | 5,091 | 18,277 | 1 | 65 | 130 | 9 | 5,156 | 18,407 |
| **2012 (ආ)** | **14** | **4,278** | **25,043** | **20** | **5,626** | **10,774** | **34** | **9,964** | **25,285** |
| පළමු කාර්තුව | 8 | 1,991 | 5,743 | 12 | 4,330 | 5,959 | 20 | 6,321 | 1,170 |
| දෙවන කාර්තුව | 2 | 822 | 13,208 | 2 | 360 | 856 | 4 | 1,242 | 14,064 |
| තෙවන කාර්තුව | 1 | 835 | 1,670 | 2 | 287 | 2,541 | 3 | 1,122 | 4,211 |
| සිව්වන කාර්තුව | 3 | 630 | 4,422 | 4 | 649 | 1,418 | 7 | 1,279 | 5,840 |

(අ) අර්ධ රාජ්‍ය සහ අනෙකුත් සියලුම පෞද්ගලික ආයතන ඇතුළත්ය
(ආ) තාවකාලික

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව

සිට 2012 වසරේ දී 34 දක්වා ඉහළ ගියේය. වැඩවර්ජන සඳහා සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව සහ අහිමි වූ මුළු මිනිස් දින ගණන 2012 වසරේ දී පිළිවෙළින් සියයට 9.7 කින් සහ සියයට 35.5 කින් අඩු විය. වතු අංශයෙහි වැඩවර්ජන සංඛ්‍යාව සහ වැඩවර්ජන සඳහා සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව සැලකිය යුතු ලෙස පහළ ගිය ද, සේවකයන් තමන්ගේ ඉල්ලීම් දිනා ගැනීම සඳහා දීර්ඝ කාලීනව වෘත්තීය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් අහිමි වූ මුළු මිනිස් දින ගණන ඉහළ ගියේය.

**සේවක, සේව්‍ය සහ නියාමක යන පාර්ශ්ව තුන අතර මනා කම්කරු සබඳතාවක් සහ අඛණ්ඩ සංවාදයක් ගොඩනගා ගැනීම තුළින්, වැඩබිම්වල වඩා යහපත් පරිසරයක් පවත්වා ගෙන යාම කාර්මික සාමය සහ ඉහළ ඵලදායිතාව ළඟා කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ.** 2000 වසරේ සිට කම්කරු ආරවුල්වල දක්නට ලැබුණු පහළ යාමේ නැඹුරුව අනුව යමින් 2011 වසරේ දී 3,756 ක් වූ කම්කරු ආරවුල් සංඛ්‍යාව 2012 වසරේ දී 3,702 දක්වා තවදුරටත් අඩු විය. මෙම ආරවුල් අරබයා සිදු කරන ලද විමර්ශන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව මගින් සමාදානය තුළින් සමථයකට පත් කිරීම අරමුණු කොටගෙන සිදු කරන ලදී. මීට අමතරව, දෙපාර්තමේන්තුව විසින් සේවා අවසන් කිරීම සම්බන්ධව කරන ලද පැමිණිලි ඵලදායක ලෙස බේරුම් කිරීමට ද දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් වඩා හොඳ සංවාදයක් ඇති කිරීමට ද කටයුතු කරන ලදී. රටෙහි වැඩකරන ජනතාවට ප්‍රතිලාභ ලබාදෙන අතර හිතකර සේව්‍ය සේවක සබඳතා ගොඩනැගීමේ අරමුණින් පවතින නීතිමය ප්‍රතිපාදන කාලීන අවශ්‍යතා සපුරන පරිදි නැවත පෙලගස්වන ලදී.

## ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ

කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2012 අංක 2 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) **පනතෙහි ප්‍රතිපාදන සමග අනුකූල වීම සඳහා පියවර කිහිපයක් ගන්නා ලදී.** මෙම සංශෝධන මගින් ජාතික හැඳුනුම්පත් අංකය යොදා ගනිමින් සේවා යෝජකයන්ට හා සේවා නියුක්තිකයන්ට හඳුනා ගැනීමේ අංකයක් ලබාදීම, සේවා නියුක්තිකයන් 50 කට වඩා සේවයෙහි යොදවා ගෙන ඇති සේවා යෝජකයන්ට ඉලෙක්ට්‍රොනික ක්‍රම මගින් තොරතුරු ලබා දීමට පහසුකම් සැපයීම සහ සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සපයන සේවා නියුක්තිකයන්ට නිවාස ප්‍රතිලාභ හා වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම යන අරමුණු සඳහා තමාගේ ගිණුමෙහි ශේෂයෙන් සියයට 30 කට නොවැඩි අරමුදල් ප්‍රමාණයක් ආපසු ගැනීමට පහසුකම් සැලසීම යනාදිය සඳහා ප්‍රතිපාදන සම්පාදනය කොට ඇත.

**කොන්ත්‍රාත්තු ශ්‍රමය, සේවා යෝජකයාගේ ව්‍යාපාරයෙහි ප්‍රධාන අංශයන්හි දැනටමත් යෙදී සිටින ශ්‍රමිකයන්ට බලපෑම් ඇතිකරන අවස්ථාවන්හි දී කොන්ත්‍රාත්තු පදනම මත ශ්‍රමිකයන් බඳවා ගැනීමට අදාළ වූ සීමා කිරීම් හඳුන්වා දීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව, 1941 අංක 27 දරන වැටුප් මණ්ඩල ආඥාපනත සංශෝධනය කිරීමට යෝජනා කොට ඇත.** දැනට මෙහි අවසාන පනත් කෙටුම්පත සඳහා රජයෙහි අනුමැතිය ලැබීමට නියමිතව ඇත. නවීන ප්‍රමිතීන්ට අනුකූලව සියලුම සේවා ස්ථාන ආවරණය වන පරිදි සේවා නියුක්තිකයන්ගේ ආරක්ෂාව, සෞඛ්‍යය හා සුබසාධනය සැලසීම සඳහා 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත, යෝජිත වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍යය ආඥාපනතින් ප්‍රතිස්ථාපනය කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, රටෙහි දැනට පවතින නීතිය හා අන්තර්ජාතික කම්කරු සංවිධානයෙහි සම්මුති අතර පවතින පරතරය අවම කිරීම සඳහා දැනට පවතින නීති සඳහා සිදු කළ යුතු සංශෝධන හඳුනා ගෙන ඇත.